ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

"අපි වනාහී යාච්ඤාවෙහිද, වචනයේ මෙහෙකිරීමෙහිද, ස්ථිර ලෙස යෙදී සිටින්නෙමුයයි කීවෝය." (ක්‍රියා 6 : 4)

84 වන වෙළුම අංක 04 (982) 2025 ජූලි / අගෝස්තු

දේව වචනය සහ යාච්ඤාව

ඇන්ඩ්‍රෑ මරේ විසිනි

"නුඹලා මා තුළේහි පවතින්නෝ නම්, මාගේ වචනය නුඹලා තුළේහි පවතී නම්, නුඹලා කැමති දෙයක් ඉල්ලාපල්ලා, එවිට නුඹලාට ලැබේ." (යොහාන් 15:7)

අපගේ ආත්මික ජීවිතය තුළ විශේෂයෙන් අපගේ යාච්ඤාව තුළ ක්‍රිස්තුස් යේසුස් වහන්සේ කරුණුකොටගෙන දෙවියන් වහන්සේගේ වචනයට විවෘතවීමට කොයිතරම් ඉඩ ලබා දී තිබෙන බව දැකිය යුතුද ? දෙවියන් වහන්සේ සර්වබලධාරී තමන්ම පැවත එන්නා වූ ස්වාමීන් වහන්සේ නිසා උන්වහනසේ ජීවනය සහ බලයත්, ආත්මය සහ සත්‍යයත් නිසා වචනවල ගැඹුරුම අර්ථයෙන් තමන්වහන්සේවම ප්‍රකාශ කරන විට එම වචන පිළිගන්නා වූ අයට උන්වහන්සේ සැබවින්ම උන්වහන්සේවම, තමන්වහන්සේගේ ප්‍රේමය සහ ජීවනය, උන්වහන්සේගේ කැමැත්ත සහ බලය ලබාදෙන සේක. උන්වහන්සේ සාමාන්‍ය මනුෂ්‍යයාගේ කල්පනාවෙන් තේරුම් ගැනීමට නොහැකි තරම් පුදුම දේ කරන සේක. සෑම පොරොන්දුවකදීම උන්වහන්සේව අල්ලා ගැනීමට සහ හිමිකර ගැනීමට අපට බලය ලබාදෙන සේක. සෑම ආඥාවකදීම උන්වහන්සේගේ කැමැත්ත, උන්වහන්සේගේ ශුද්ධකම, උන්වහන්සේගේ සම්පූර්ණත්වය අප සමඟ බෙදා ගැනීමට අපට හැකියාව, බලය ලබාදෙන සේක. දෙවියන් වහන්සේගේ වචනයෙන් දෙවියන් වහන්සේවම අපට ලබාදෙන සේක. උන්වහන්සේගේ වචනය සදාකාලික පුත්‍රයාණන් වන ක්‍රිස්තුස් වහන්සේට වඩා අඩු දෙයක් නොවේ. ක්‍රිස්තුස් වහන්සේගේ සියලු වචන දෙවියන් වහන්සේගේ වචන වන අතර ඒවා දිව්‍යමය බලයෙන් සහ ජීවනයෙන් පිරී ඇත. **"ජීවත්කරන්නේ ආත්මයය. මාංශයෙන් කිසි ප්‍රයෝජනයක් නැත. මා නුඹලාට කී වචන ආත්මය ද ජීවනය ද වෙයි." (යොහාන් 6.63)**

බිහිරි සහ ගොළු අයව අධ්‍යයනය කළ අය අපට පවසන්නේ කථා කිරීමේ බලය ශ්‍රවණ හැකියාව මත කොපමණ රඳා පවතිනවාද කියා සහ දරුවන්ගේ ශ්‍රවණ හැකියාව නැතිවීමත් සමඟ කථා කිරීමේ හැකියාවද නැතිවන බවයි. මෙය පුළුල් අර්ථයකින් සත්‍යයතාවයකි. අපට ඇසෙන ආකාරයටම අපි කථා කරන්නෙමු. දෙවියන් වහන්සේ සමඟ අපගේ ඉහළම සම්බන්ධතාවයේ අර්ථයෙන් මෙය සත්‍යයවේ.

ආත්මයෙන් යාච්ඤා කිරීම, දෙවියන් වහන්සේ වෙතට ළඟාවන සහ ස්පර්ශ වන වචන කථා කිරීම, නොපෙනන ලෝකයේ බලවේගයන්ට බලපාන සහ බලපෑම් කරන වචන කථා කිරීම, එවැනි යාච්ඤා කිරීම සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ දෙවියන් වහන්සේගේ හඬට අපි සවන්දීම මතය. දෙවියන් වහන්සේගේ වචන වලින් උන්වහන්සේගේ සිතුවිලි, උන්වහන්සේගේ මනස, උන්වහන්සේගේ ජීවිතය, අපගේ හදවතට ලබාගෙන දෙවියන් වහන්සේට සවන්දීම තුළ හදවත් වලට කථාකරන භාෂාව කථා කිරීමට අපි ඉගෙන ගන්නෙමු. දෙවියන් වහන්සේට සවන්දීමට ඉගෙන ගැනීමේ සාක්ෂි ලෙස උදයක් පාසා උදයක් දෙවියන් වහන්සේට සහ මනුෂ්‍යයන්ට ද කථා කිරීමේ හැකියාව ලබාදෙන උගතුන්ගේ කණ සහ උගතුන්ගේ දිව ලබා ගැනීමට සූදානම් කරනු ලබයි. (යෙසායා 50:4)

දෙවියන් වහන්සේගේ වචන වලින් දෙවියන් වහන්සේ සමඟ ඇසුරු කිරීම

දෙවියන් වහන්සේගේ හඬ ඇසීම යනු වචනය පිළිබඳ කල්පනාකාරී අධ්‍යයනයකට වඩා වැඩි දෙයකි. ජීවමාන දෙවියන් වහන්සේ සමඟ සැබෑ සහයෝගීතාවයක් නොමැතිව වචනය පිළිබඳව හොඳ අධ්‍යයනයක් සහ හොඳ දැනුමක් තිබිය හැකිය. නමුත් දෙවියන් වහ්නසේගේ අභිමුඛයේ පියාණන් වහන්සේ ඉදිරියේම ආත්මයාණන් වහන්සේගේ මඟපෙන්වීම මත වචනය කියවීමක් ද ඇත. එහිදී වචනය දෙවියන් වහන්සේගෙන්ම ජීවමාන බලයෙන් අප වෙත පැමිණේ. එය පියාණන් වහන්සේගේම හඬයි. උන්වහන්සේ සමඟ සැබෑ පුද්ගලික සහයෝගීතාවයකි. හදවතට ඇතුල්වන දෙවියන් වහන්සේගේ හඬ එයයි. එය ආශිර්වාදය සහ ශක්තිය ගෙන එයි. එමෙන්ම දෙවියන් වහන්සේගේ හදවතට නැවත ළඟාවෙන ජීවමාන ඇදහිල්ලක ප්‍රතිචාරය අවදි කරයි. කීකරුවීමට සහ විශ්වාස කිරීමට ඇති බලය රඳාවපවතින්නේ මෙම හඬ ඇසීම මතය. ප්‍රධාන දෙය නම් දෙවියන් වහන්සේ අප කළ යුතු යැයි පැවසූ දේ දැන ගැනීම නොව, දෙවියන් වහන්සේම එය අපට පවසන බව දැන ගැනීමයි. කීකරුකම ක්‍රියාත්මක කරන්නේ ව්‍යවස්ථාවේ නීති පොත්වත් හරි දේ පිළිබඳ දැනුමවත් නොවේ. නමුත් කීකරුකම ක්‍රියාත්මක කරන්නේ දෙවියන් වහන්සේගේ පුද්ගලික බලපෑම සහ උන්වහන්සේගේ ජීවමාන සහයෝගීතාවයයි. දෙවියන් වහන්සේ පොරොන්දු වූ දේ පිළිබඳ දැනුම නොව පොරොන්දු වූ තැනැන්වහන්සේ ලෙස දෙවියන් වහන්සේම සිටීම යාච්ඤාව කෙරෙහි ඇදහිල්ල සහ විශ්වාසය අවදිකරයි. අවිශ්වාසය සහ අකීකරුකම කළ නොහැකි වන්නේ දෙවියන් වහන්සේගේ පූර්ණ අභිමුඛයේ දී පමණි.

"නුඹලා මා තුළේහි පවතින්නෝ නම්, මාගේ වචනය නුඹලා තුළේහි පවතී නම්, නුඹලා කැමති දෙයක් ඉල්ලාපල්ලා. එවිට නුඹලාට ලැබේ." ගැලවුම්කරුවාණන් අපට දෙන වචන වලින් මෙහි තේරුම අපට පෙනෙන්නේය. උන්වහන්සේගේ වචනය අප තුළ තිබිය යුතුය. අපගේ කැමැත්ත තුළ, ජීවිතය තුළ, එය පැවතිය යුතුය. අපගේ ස්වභාවය සහ හැසිරීම තුළ ප්‍රතිනිෂ්පාදනය කළ යුතුය. අපගේ මුළු ජීවිතයම උන්වහන්සේගේ වචන තුළ අඛණ්ඩව හෙළිදරව් විය යුතුය. එය අපව පුරවනු ලබයි. උන්වහන්සේගේ වචනය අප තුළ පැවතීමෙන් ක්‍රිස්තුස් වහන්සේව ප්‍රකාශ වේ. උන්වහන්සේ නැතිව අපගේ ජීවිත ප්‍රකාශවන්නේ නැත. ක්‍රිස්තුස් වහන්සේගේ වචනය අප තුළට ඇතුල්වී අපගේ ජීවිතය බවට පත්වී ඇත. එහි බලපෑමෙන් අපගේ වචන උන්වහන්සේගේ හදවතට ඇතුල්වී උන්වහන්සේ තුළ බලපෑමෙන් යුතුව යාච්ඤා කිරීම මා තුළ රඳා පවතියි. දෙවියන් වහන්සේ මට සහ මා තුළ ඇති දේ වන අතර මාගේ වචන දෙවියන් වහන්සේ සහ උන්වහන්සේ තුළ වන්නට පටන් ගන්නේය.

දෙවියන් වහන්සේගේ වචනයට ප්‍රේමණීය ප්‍රතිචාරය දැක්වීම

දෙවියන් වහන්සේගේ වචනය සහ අපගේ වචන අතර පවතින මෙම සම්බන්ධතාවය පැරණි ගිවිසුමේ ශුද්ධවන්තයන් කොයිතරම් හොඳින් තේරුම් ගත්තාද ? යාච්ඤා කරමින් දෙවියන් වහන්සේ කථා කරන දේ අසා ඊට ප්‍රේමණීය ප්‍රතිචාරයක් දැක් වූ ආකාරය දෙස බලන්න. වචනය පොරොන්දුවක් නම් දෙවියන් වහන්සේ කථා කළ පරිදි කිරීමට ඔවුන් බලාපොරොත්තු වූහ. **"පැවසූ පරිදි කරන්න". "වක්නිසාද ස්වාමිනි ඔබ එය ප්‍රකාශකර ඇත." "ඔබගේ පොරොන්දුවට අනුව" "ඔබගේ වචනයට අනුව"** වැනි ප්‍රකාශ වලින් පෙන්වා දුන්නේ දෙවියන් වහන්සේ පොරොන්දුවෙන් කථා කළ දේ ඔවුන් යාච්ඤාවෙන් කථා කළ දෙයෙහි මුල සහ ජීවය බවයි.

වචනය ආඥාවක් නම් ඔවුන් කළේ ස්වාමීන් වහන්සේ පැවසූ දෙයයි. **"වෙසේ ආබ්‍රම් ස්වාමීන් වහන්සේ නවාට කී ලෙස ගියේය..."** (උත්පත්ති 12:4) ඔවුන්ගේ ජීවිත දෙවියන් වහන්සේ සමඟ සහභාගීත්වයක්, වචන සහ සිතුවිලි හුවමාරුවක් විය. දෙවියන් වහන්සේ කථා කළ දෙය ඔවුන් අසා ක්‍රියාවට නැංවීය. ඔවුන් කතා කළ දේ දෙවියන් වහන්සේ අසා එය ඉටු කළ සේක. දෙවියන් වහන්සේ කථා කළ සෑම වචනයක්ම ඉටු කිරීමට ක්‍රිස්තුස් වහන්සේම අප වෙනුවෙන් තමන්වහන්සේවම ලබා දුන් සේක. උන්වහන්සේ ඉල්ලා සිටින්නා වූ සෑම වචනයක් තුළ පවතින මනුෂ්‍යයා එය සම්පූර්ණව පිළිපැදීමට සහ ඉටුවීම ලබා ගැනීමට නොඅඩුව ඉල්ලා සිටින්නේය.

කැමැත්තෙන් භාවිතා වන මෙවලම්

"නුඹලා මාගේ වචනය තුළ පවතින්නෝ නම් ...." මෙම තත්ත්වය සරලව සහ පැහැදිලිව තිබේ. උන්වහන්සේගේ වචන වලින් උන්වහන්සේගේ කැමැත්ත හෙළිදරව්වේ. උන්වහන්සේගේ වචන මා තුළ පවතින විට උන්වහන්සේගේ කැමැත්ත මාව පාලනය කරනු ලබයි. මාගේ කැමැත්ත උන්වහන්සේගේ කැමැත්ත පුරවන හිස්භාජනය බවට පත්වේ. මාගේ කැමැත්ත උන්වහන්සේගේ කැමැත්ත භාවිතා කරන කැමැත්තෙන් යුතු මෙවලම බවට පත්වේ. උන්වහන්සේගේ මාගේ අභ්‍යන්තරය පුරවන සේක.

2 පිටුවට

දේව වචනය සහ යාච්ඤාව

1 පිටුවෙන්

කීකරුකම සහ ඇදහිල්ල ක්‍රියාත්මක කිරීමේ දී මාගේ කැමැත්ත තව තවත් ශක්තිමත් වන අතර උන්වහන්සේ සමඟ ගැඹුරු අභ්‍යන්තර එකඟතාවයකට ගෙනඑනු ලබයි. දෙවියන් වහන්සේගේ කැමැත්ත සම්පූර්ණයෙන්ම විශ්වාස කිරීම මිස තමාගේම කැමැත්ත කෙරෙහි විශ්වාස කිරීමට නොහැකිය. **"මාගේ වචනය නුඹලා තුළ පවතී නම් නුඹලා කැමති දෙයක් ඉල්ලාපල්ලා. එවිට නුඹලාට ලැබේ."** යන පොරොන්දුව උන්වහන්සේ ලබාදෙන සේක. එය විශ්වාසකර ඒ අනුව ක්‍රියාකරන සියල්ලන්ටම උන්වහන්සේ එය වචනානුසාරයෙන් සැබෑ කරනු ඇත.

ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලයෙනි. පිළිතුරු නොලැබුණු අපගේ යාච්ඤාවන් සහ යාච්ඤාවේ දුර්වලතාවයන් නිසා දෙවියන් වහන්සේගේ ප්‍රඥාවට සහ කැමැත්තට මනඃකල්පිත යටහත්වීමකින් සමාව ඇයද සිටියද සැබෑම හේතුව අපගේ දුර්වල ජීවිතය අපගේ දුර්වල යාච්ඤාවන්ට හේතුවී ඇති බව අපට වඩාත් පැහැදිලි වෙමින් තිබෙනවාද? මනුෂ්‍යයන්ව ශක්තිමත් කළ හැකි වන්නේ දෙවියන් වහන්සේගේ මුඛයෙන් අප වෙත එවන වචනය කරුණුකොටගෙන අප ජීවත්වීමෙන්ය. ක්‍රිස්තුස් වහන්සේගේ වචනයට ප්‍රේම කරමින්, ඒ තුළ ජීවත් වෙමින්, කීකරුකම සහ ක්‍රියාව තුළින් අපගේ පැවැත්මේ කොටසක් බවට පත්වී අපව ක්‍රිස්තුස් වහන්සේ සමඟ එක් කරනු ලබයි. දෙවියන් වහන්සේව ස්පර්ශ කිරීමට සහ අල්ලා ගැනීමට අපට ආත්මිකව සරිලන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ වචනයයි.

ප්‍රේමණීය ස්වාමීනී, අද දවසේ ඔබවහන්සේ ඉගැන්වූ පාඩමෙන් මගේ අණුවනකම නැවතත් මට හෙළිදරව් විය. මගේ යාච්ඤාව ජයග්‍රාහිකව සහ විශ්වාසයෙන් නොතිබූ බව මට පෙනේ. ඔබවහන්සේ මට කථා කරනවාට වඩා මම ඔබවහන්සේට කථා කිරීමට කාර්යබහුල විය. ඇදහිල්ලේ රහස මෙයයි කියා මට තේරුණේ නැත. මාගේ ආත්මය තුළ ජීවමාන වචනයක් ඇති තාක් දුරට ඇදහිල්ලක් තිබිය හැකිය. ඔබවහන්සේගේ වචනය මට එය පැහැදිලිව ඉගැන්වූ **සේක. "මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, නුඹලා වේක දන්නහුය. නුවුත් එක එක මනුෂ්‍යයා ඇසීමට ඉක්මන් වේවා!, කථා කිරීමටත් උදහස්වීමත් ප්‍රමාද වේවා!". (යාකොබ් 1:19) "නුඹේ වුඹයෙන් ඉක්මන්කාර නොවන්න, නුඹේ සිතද දෙවියන් වහන්සේ ඉදිරියෙහි කාරණයක් නිකුත් කරන්ට ඉක්මන් නොවේවා!. එක්නිසාද දෙවියන් වහන්සේ ස්වර්ගයෙහිය. නුඹ පොළොවෙහිය. ඒ නිසා නුඹේ වචන ස්වල්ප වේවා!."** (දේශනාකාරය 5:2) ඔබගේ වචනය මාගේ ජීවිතයට ගෙන ඒමෙන් පමණක් මාගේ වචන ඔබගේ හදවතට ගෙන ඒමට හැකිවනු ඇත. ඔබගේ වචන මා තුළෙහි ජීවමාන බලයක් නම් එය ඔබවහන්සේ සමඟ ජීවමාන වනු ඇත. ඔබගේ මුඛයෙන් පැවසූ දේ ඔබගේ අත්වලින් ඉටුකරනු ලබන සේක.

ස්වාමීනී, අචර්මච්ඡේදිත කන් ඇතුව සිටීමෙන් මාව මුදාගත මැනව. පියාණන් වහන්සේ හඬ ඇසීමට උදයෙන් උදය අවදි වූ ගෝලයෙකුගේ විවෘත කණ මට ලබා දුන මැනව. ඔබ ඇසූ දේ පමණක් කථා කළාක් මෙන් මාගේ කථාව ඔබ මට කථා කිරීමේ දෝංකාරය **වේවා. "මෝසෙස් උන්වහන්සේ සමඟ කථා කරන පිණිස සවිමුඩවීමේ කූඩාරමට ඇතුල් වන කළ , සාක්ෂි පෙට්ටිය පිට තිබුණු කරුණාසනය සිට කෙරුබිවරු දෙදෙනා අතරෙන් තමාට කථා කරන හඬ ඔහුට ඇසුණේය. ඔහුද උන්වහන්සේට කථා කළේය."** (ගණන් කථාව 7:89) ස්වාමීනී, මටත් එසේම වේවා!. ඔබගේ වචන එහි පවතින අතර එය තුළ දක්නට ලැබෙන පරිදි එකම සලකුණක් දරණ ජීවිතයක් සහ චරිතයක්, සම්පූර්ණ ආශීර්වාදයක් සඳහා සූදානම්වීමක් වේවා. ඔබ කැමති දේ ඉල්ලන්න. එවිට එය ඔබට ඉටුවේ. ආමේන් ..!

දෙවියන් වහන්සේගේ වචනය ඉතා පුද්ගලික ත්‍යාගයකි

රිච් කාර්මයිකල් විසිනි

පෙරමඟ දූතයා කලාපයක සඳහන් ලිපියක් කියවමින් සිටියදී මිෂනාරී සේවයේ යෙදුණු මිෂනාරීවරයෙකුගේ කථාවේ සඳහන් ශුද්ධ ලියවිලි කොටසක් මට විශේෂයෙන් බලපෑමක් කළේය. දුෂ්කර කාලවලදී ස්වාමීන්වහන්සේ මාරී මොන්සන්ට උපකාර කිරීම සඳහා පාවිච්චි කළ බයිබල් පදය ඇය බෙදාගත්තාය. **"භය නොවන්න, එක්නිසාද එව නුඹ සමඟ සිටිමි. තැතිනොගන්න, එක්නිසාද එව නුඹේ දෙවියන් වහන්සේය. එව නුඹ ශක්තිමත්කොට , නුඹට උපකාර කරන්නෙමි. එසේය, මාගේ ධර්මිෂ්ඨකම නැවති දකුණතින් නුඹ උසුලන්නෙමි."** (යෙසායා 41:10) එම පදය කෙරෙහි තදින් යොමුවීමට හේතුවූයේ මෑතකදී දෙවියන් වහන්සේ එම පදයෙන් ගැඹුරින් මට ආශීර්වාද කළ බැවිනි. ඒ අවස්ථාවේ දී මම තීරණාත්මක මොහොතක තීරණයක් ගනිමින් සිටියදී ක්‍රිස්තුස් වහන්සේ තුළ එක් සහෝදරයෙක් යෙසායා 41:10 කියනු ලැබීය. එය ස්වාමීන්වහන්සේගෙන් මට ලැබුණු වචනයක් ලෙස මාගේ හදවතට කෙලින්ම ඇතුළු විය. ඒ මොහොතේ උන්වහන්සේ මා සමඟ සිටින බවත්, මට උපකාර කරන බවත්. මාව උසුලන බවත් දැන සිටි නිසා ස්වාමීන්වහන්සේ මගේ හදවත මහත් සහතිකයකින්, ධෛර්යයකින් සහ සමාදානයකින් පුරවනු ලැබූ සේක. ඒ මොහොතේ උන්වහන්සේ මට සේවය කළා පමණක් නොව උන්වහන්සේ එම පදය මගේ මතකයට ගෙනැවිත් ඒ තුළින් මට ආශීර්වාද කළ සේක. උන්වහන්සේ අපට ළංවන ආකාරය සහ උන්වහන්සේගේ වචනය තුළින් අපට සේවය කරන ආකාරය ගැන ස්වාමීන්වහන්සේට ප්‍රශංසා කරන්න.

ස්වාමීන්වහන්සේට පුද්ගලික කාරණයක්

ස්වාමීන්වහන්සේ විසින් කරන ලද එවැනි සේවයක් ඇත්තෙන්ම පුදුමයක් නොවේ. මක්නිසාද වචනය උන්වහන්සේට ඉතා පුද්ගලික කාරණයකි. සියල්ලට පසුව වචනය උන්වහන්සේගේ වචනයයි. එය උන්වහන්සේගේ මුඛයෙන් නික්මෙන්නේ උන්වහන්සේගේ අරමුණ ඉටුකර ගැනීම සඳහාය. (යොසයා 55:11) ඒ හරහා උන්වහන්සේ තමන්වහන්සේව, උන්වහන්සේගේ චරිතය, උන්වහන්සේගේ මාර්ග, උන්වහන්සේගේ අරමුණු, උන්වහන්සේගේ සැලසුම් සහ උන්වහන්සේගේ පොරොන්දු හෙළි කරනු ලබයි. ඊටත් වඩා උන්වහන්සේ වචනය තුළින් තමන් වහන්සේවම ලබාදෙන සේක. ඇන්ඩ්‍රෑ මරේ මුල් පිටුවේ ලිපියෙන් සඳහන් කරන පරිදි දෙවියන් වහන්සේ තම වචන වලින් තමන්වහන්සේව ප්‍රකාශ කරනවිට උන්වහන්සේ සැබවින්ම තමන් වහන්සේව, උන්වහන්සේගේ ප්‍රේමය සහ ජීවිතය, උන්වහන්සේගේ කැමැත්ත සහ බලය මෙම වචනය පිළිගන්නන්ට ලබාදෙන බවයි. අවසානයේ දී දෙවියන් වහන්සේගේ වචනයේ අපට ඉතා වටින්නේ මෙයයි. එනම්, උන්වහන්සේ තමන්ව සහ උන්වහන්සේගේ හදවතේ ඇති සියල්ල බෙදාගන්නේ උන්වහන්සේගේ වචනයෙනි. උන්වහන්සේගේ ආශාව නම් ඒ තුලින් අපි උන්වහන්සේව වඩා හොඳින් දැන හැඳිනගෙන උන්වහන්සේ සමඟ අපේ ඇසුර වර්ධනය කර ගැනීමයි.

උන්වහන්සේට අවශ්‍ය වන්නේ අප සෑම කෙනෙකුටම පුද්කලිකව සේවය කිරීමට සහ උන්වහන්සේගේ වචනය තුලින් අපගේ අවශ්‍යතා සපුරාලීමයි. උන්වහන්සේ අපට බොහෝ ප්‍රේමකරන අතර, අපව ශක්තිමත් කිරීම සඳහා උන්වහන්සේගේ වචනය අපට ලබාදෙන සේක. (ගීතාවලිය 119:28), අපගේ ඇදහිල්ල ගොඩනගා ගැනීමට (යොහාන් 20:31, රෝම 10:17) අපව පවිත්‍රකර විශුද්ධ කිරීමට (ගීතාවලිය 119:9, යොහාන් 17:17, එපීස 5:26-27) අපව නිදහස් කිරීමට (යොහාන් 8 : 31-32) අපව පෝෂණය කිරීමට (1 ප්‍රේත්‍රුස් 2:2-3), අපට ධර්මිෂ්ඨකම ඉගැන්වීමට, අවවාද කිරීමට, නිවැරදි කිරීමට හා උපදෙස් දීමට (2 තිමෝති 3:16) පාපය ජය ගැනීමට අපට උපකාර කිරීමට (ගීතාවලිය 119:11) අපට උපදෙස්දීමට (ගීතාවලිය 119:24) අපට සැනසිල්ල සහ බලාපොරොත්තුව ලබාදීමට (රෝම 15:4) අපව සුව කිරීමට හා මුදා ගැනීමට (ගීතාවලිය 107:20), අපට ගැලවීමේ සහතිකය ලබාදීමට (1 යොහාන් 5:13), ආත්මික යුද්ධය සඳහා අපව සන්නද්ධ කිරීමට (3:17), යහපත සහ නපුර වෙන්තර හඳුනා ගැනීමට උපකාර කිරීමට (හෙබ්‍රෙව් 5:14) අපට අවවාද කිරීමට (ගීතාවලිය 119:11, 1 කොරින්ති 10,11) අපව දැනුවත් කිරීමට, අපව මෙහෙයවීමට හා මඟපෙන්වීමට (ගීතාවලිය 119:105) අපව ප්‍රීතියෙන් පිරවීමට (ගීතාවලිය 19:8) අපට අවබෝධය ලබාදීමට (ගීතාවලිය 119:169), ජීවිතයේ කුණාටු විඳදරා ගැනීමට ශක්තිමත් පදනමක ලබාදීමට (මතෙව් 7:24-25) යන ආදී ලැයිස්තුව දිගටම පවතී.

ස්වාමීන් වහන්සේගේ වචනය අපට කොයිතරම් අනර්ඝ ත්‍යාගයක් ද ? ගීතිකාකරු මෙසේ ප්‍රකාශ කිරීම පුදුමයක් නොවේ. **"එහන් කොල්ලයක් ළඟන කෙනෙකු මෙන් මව ඔබගේ වචනයෙහි ජීතිවත් වෙමි." (ගීතාවලිය 119:162)**

අපගේ පුද්ගලික ප්‍රතිචාරය

නිසැකවම ස්වාමීන්වහන්සේගෙන් ලැබෙන එවැනි වටිනා සහ පෞද්ගලික ත්‍යාගයක් අපෙන් ඉතා පුද්ගලික ප්‍රතිචාරයක් ඉල්ලා සිටියි. අපගේ මුළු පැවැත්මෙන් එනම්, මුළු හදවතින්, මුළු ආත්මයෙන්, මුළු බුද්ධියෙන්, මුළු ශක්තියෙන් උන්වහන්සේට ප්‍රේම කිරීමටත්, උන්වහන්සේගේ වචනය අපගේ හදවත් තුළ තිබීමටත් ස්වාමීන්වහන්සේට අවශ්‍යව තිබෙන සේක. (ද්විතිය කථාව 6:5-6) උන්වහන්සේට අවශ්‍ය වන්නේ අපි උන්වහන්සේගේ වචනයට සම්පූර්ණයෙන්ම කැපවී සිටීමයි. එමෙන්ම එය කියවීමට, මෙනෙහි කිරීමට, අධ්‍යයනය කිරීමට, මතක තබා ගැනීමට, එයට කීකරුවීමට, එයින් යාච්ඤා කිරීමට සහ එය අන් අය සමඟ බෙදා ගැනීමට යොමුවීමයි. උන්වහන්සේට අවශ්‍ය වන්නේ අපි දේව වචනය යටපත් කරන සියලු බාධාවන්ගෙන් වැළකී උතුම් හා යහපත් හදවතකින් එය ලබා ගැනීමට සහ එය තබාගෙන ඵල දැරීමටයි. (ලුක් 8: 14-15)

ස්වාමීන්වහන්සේ පහත සඳහන් ප්‍රශ්නය අසන අතර ඉන්පසුව ආරාධනාවක් ලබාදෙන සේක. **"කෑව නොවන දේට මුදල් ද තෘප්තියට නොපවුණුවන දේට නුඹලාගේ වස්තුව ද වියදම් කරන්නේ එක්නිසාද හොඳාකාරයෙන් මට ඇහුම්කන්දී හොඳව තිබෙන දේ කාපල්ලා. නුඹලාගේ ප්‍රාණය ද තරකම භුක්තිවිඳීවා. නුඹලාගේ කන් යොමා මා ළඟට ඇවිත් අසාපල්ලා. එවිට නුඹලාගේ ප්‍රාණය ජීවත්වන්නේය. මව ද දාවිත්ගේ සහතික කරුණාවල් වන සදාකාල ගිවිසුමක් නුඹලා සමඟ කරන්නෙමි."** (යෙසායා 55:1:2) එය කොපමණ අලංකාර ආරාධනාවක්ද ? **"මා ළඟට ඇවිත් ...." "හොඳාකාරයෙන්ම මට ඇහුම්කන්දී ..."** මෙය

3 පිටුවට

දෙවියන් වහන්සේගේ වචනය ඉතා...

ඊව් කාර්මයිකල් විසිනි

ස්වාමීන්වහන්සේට කොයිතරම් පුද්ගලික ද කියා බලන්න. ස්වාමීන්වහන්සේට උන්වහන්සේගේ වචනය තුළින් අප සමඟ බෙදා ගැනීමට බොහෝ දේ ඇත. එමෙන්ම උන්වහන්සේට අප තුළ සහ අප තුළින් කිරීමට කැමති බොහෝ දේ ඇත. ප්‍රශ්නය නම් අපි උන්වහන්සේට වඩාත් පුද්ගලිකව ප්‍රතිචාරය දක්වනවාද සහ අපි උන්වහන්සේගේ වචනයෙන් උන්වහන්සේව මුණගැසී උන්වහන්සේ කැමති තරම් ගැඹුරින් අප තුළ ක්‍රියා කිරීමට ඉඩ දෙනවාද යන්නයි.

පෙරමඟ දූතයා මෙම කලාපය පිළිඳව

මේ සියල්ල මතකයේ තබාගෙන දෙවියන් වහන්සේගේ වචනය සහ එය අපගේ ජීවිත තුළ ඉටුකළ යුත වැදගත් කාර්යභාරය පිළිබඳව මෙම කලාපයේ දිරිගැන්වීම් ලබාදීම ගැන පෙරමඟ දූතයා කාර්යමණ්ඩලයට ස්තුතිවන්ත වන්නෙමු ඔබත් අප මෙන් ස්වාමීන්වහන්සේ සමඟ උන්වහන්සේගේ වචනය තුළින් වැඩි කාලයක් ගතකිරීමට පෙළඹෙනු ඇතැයි බලාපොරොත්තු වන්නෙමු. දේව වචනය ජීවමානය, බලවත්ය. (හෙබ්‍රෙව් 4:12) එමෙන්ම අප තුළ ගැඹුරින් ක්‍රියාකරනු ඇත. (1 තෙසලෝනික 2:13)

යාච්ඤාව සම්බන්ධයෙන් ද මෙම කලාපය තුළ දිරිගැන්වීම් ඇතුළත් කිරීමට අපට ආශිර්වාද ලැබී ඇත. විශේෂයෙන් යාච්ඤාවේදී උනන්දුව සහ නොපසුබට උත්සාහය අවශ්‍ය වන්නේය. වචනය සහ යාච්ඤාව නිසැකවම ක්‍රිස්තියානි ජීවිතයේ මූලික කරුණු දෙකකි. තවද සියවස් ගණනාවක් පුරා ඇදහිලිවන්තයන් සොයාගෙන ඇති පරිදි දෙවියන් වහන්සේගේ සෙනග' උන්වහන්සේගේ වචනය සහ යාච්ඤාව තුළින් උන්වහන්සේ වෙත ළංවන සෑම අවස්ථාවකදීම උන්වහන්සේ ඔවුන්ට ළංවී උන්වහන්සේගේ ජීවනයෙන් සහ බලයෙන් ඔවුන්ව පුරවන සේක. අපගේ කාලයේ දී මෙය දැඩි ලෙස අවශ්‍යය නොවේද ? තනි තනිව හා සාමූහික වශයෙන් උන්වහන්සේව වඩා හොඳින් දැන හැඳින ගැනීමටත්, උන්වහන්සේගේ ජීවනයෙන් සහ බලයෙන් පිරී ඉතිරී යාමටත් අපි උන්වහන්සේගේ වචනයට හා යාච්ඤා කිරීමට විශ්වාසවන්ත වෙමු. සියල්ල උන්වහන්සේගේ මහිමය උදෙසාය.

රහසින් යාච්ඤා කිරීමේ ප්‍රමුඛතාවය සහ සතුට

ඊ.එම්. බවුන්ඩ්ස් විසිනි.

“තවද ඔවුන් විසින් නොවැළිව නිතර යාච්ඤා කරන්ට ඕනෑ බව දක්වන පිණිස උන්වහන්සේ ඔවුන්ට උපමාවක් කියන සේක. ...” (ලූක් 18:1) මෙම උපමාවේ වචන අපගේ ස්වාමීන්වහන්සේගේ වචන අතර උන්වහන්සේ තම අනුගාමිකයන්ට යාච්ඤාවේ අවශ්‍යතාවය සහ වැදගත්කම කාවැද්දීමට සෑමවිටම උත්සාහ කළා පමණක් නොව ඔවුන්ට ආදර්ශයක් ලබා දුන් සේක. කණගාටුදායක දේ නම් අපි එය ඉටු කිරීමට බොහෝ සෙමින් ක්‍රියාකර තිබීමයි.

යාච්ඤා කිරීම යනු දවසේ කාර්යබහුල හෝ වෙහෙසකර කෙළවරවලදී රැස්ව සිට කළ යුතු අර්ථ විරහිත කාර්යයක් හෝ යුතුකමක් නොවේ. එමෙන්ම උදෑසන කඩිමුඩියේ හෝ රාත්‍රියේ ප්‍රමාද වී දණගසාගෙන සිටින මිනිත්තු කිහිපයකින් අපි සෑහීමකට පත්වන විට හෝ දවසේ කාර්යයන් වලින් වෙහෙසට පත්ව, අපගේ ශරීර විවේකය ඉල්ලා සිටින විට යාච්ඤා කිරීමට උත්සාහ දැරීමෙන් අපි අපගේ ස්වාමීන්වහන්සේගේ අණට කීකරු නොවන්නෙමු. දෙවියන් වහන්සේ සෑම විටම අපගේ හඬට සවන්දීමට බලා සිටින බව සත්‍යතාවයයි. උන්වහන්සේගේ දෙකන් සෑම විටම උන්වහන්සේගේ දරුවන්ගේ මොරගැසීමට අවධානයෙන් සිටින සේක. එම නිසා අපි යාච්ඤාවෙන් උන්වහන්සේව අමතන විට කඩිමුඩියේ වචන කිහිපයක් යාච්ඤාව සඳහා භාවිතා කළහොත් අපට කිසිවිටෙකත් උන්වහන්සේව දැන හඳුනා ගැනීමට නොහැකිය.

සමීපතාව වර්ධනයවීම අවශ්‍ය වේ. දෙවියන් වහන්සේව දැන හඳුනා ගැනීම අපගේ වරප්‍රසාදයක් බැවින් කෙටි, කොටස් වශයෙන් සහ නොසැලකිලිමත් ලෙස නැවත නැවත කරන මැදිහත්වීම් මගින් අපට කිසි විටෙකත් උන්වහන්සේව හඳුනාගත නොහැකිය. ඒවා පුද්ගලික අනුග්‍රහයන් සඳහා වන ඉල්ලීම් වන අතර ඊට වඩා වැඩි දෙයක් නොවේ. අපට ස්වර්ගීය රජතුමා සමඟ සන්නිවේදනයට පැමිණිය හැකිවන්නේ එලෙසින් නොවේ. යාච්ඤාවේ ඉලක්කය දෙවියන් වහන්සේ විසින් ඇහුම්කන් දෙනු ලැබීමයි. එය ළඟා කරගත හැකි වන්නේ ඉවසිලිවන්තව සහ අඛණ්ඩව උන්වහන්සේ කෙරෙහි බලා සිටීමෙන් අපගේ හදවත් උන්වහන්සේ ඉදිරියෙහි වගුරුවා අපට කථා කිරීමට උන්වහන්සේට ඉඩදීමෙන් පමණි. එසේ කිරීමෙන් පමණක් අපට උන්වහන්සේව දැනහඳුනා ගැනීමට අපේක්ෂා කළ හැකි වන අතර අපි උන්වහන්සේව වඩා හොඳින් දැනගන්නා විට අපි උන්වහන්සේගේ අභිමුඛත්වයේ වැඩි කාලයක් ගතකර එම අභිමුඛත්වයේ නිරන්තයෙන් වර්ධනය වන සතුට සොයා ගන්නෙමු.

ස්වාමීන්වහන්සේ සමඟ නිරන්තර ඇසුර

නිරන්තරයෙන් යන්නෙන් අදහස් කරන්නේ අපි ජීවිතයේ සාමාන්‍යය යුතුකම් නොසලකා හැරිය යුතු බව නොවේ. එහි අදහස නම්, යාච්ඤා කුටියේ නිහඬතාවය තුළ දෙවියන් වහන්සේ සමඟ සමීප සම්බන්ධතාවයකට පැමිණි ආත්මය කිසි විටෙකත් පියාණන් වහන්සේ සමීප ඇති සම්බන්ධතාවයෙන් ඉවත් නොවන බවත් හදවත සෑමවිටම ප්‍රේමණීය සහයෝගීතාවයෙන් උන්වහන්සේ වෙතටම ගමන් කරන බවත්, මනස එය නිරත වී සිටින කාර්යයෙන් නිදහස් වූ මොහොතේ කුරුල්ලෙකු නැවත තම කුඩුවට යන ආකාරයට ස්වභාවිකවම දෙවියන් වහන්සේ වෙතට නැවත පැමිණෙන බවත්ය. අපි මෙම ආලෝකයෙන් එය සලකන්නේ නම් අපි නිරන්තර සහයෝගීතාවයකින් රජතුමා සමඟ සමීප ශ්‍රාවකයන් ලෙස අපට යාච්ඤාව පිළිබඳ කොපමණ අලංකාර සංකල්පයක් තිබේද ? අපි එය ඉටු කළ යුතුකමක් ලෙස නොව භුක්තිවිඳිය යුතු වරප්‍රසාදයක් වශයෙන් සලකන්නෙමු. එය සෑමවිටම නැවුම් අලංකාරයක් (අත්දැකීමක්) ලබාදෙන අතර දුර්ලභ සතුටක් ලෙස සලකන්නෙමු.

මේ අනුව අපි උදෑසන දෑස් විවෘත කරන විට අපේ සිතුවිල්ල ක්ෂණිකව ස්වර්ගය වෙත නැගේ. බොහෝ කිතුණුවන්ට උදෑසන වේලාවන් දවසේ වටිනාම කොටසයි. මන්ද එම කාලය දවසේ ප්‍රධාන පණිවිඩය හරහා ශුද්ධ වූ සහයෝගීතාවයට අවස්ථාව ලබාදෙන කාලය බැවිනි. අලුත් දවසක නොනවතින මහිමය හා පුදුමය ගැන දෙවියන් වහන්සේ සමඟ ගත කිරමට වඩා හොඳ හැඳින්වීමක් තවත් තිබේද ? වෙනත් ස්ථානයක් නොතිබූ බැවින් මූඩි මහතා ගල්අඟරු ගබඩාවේ සිට උදෑසන කාලයේ දී තම හදවත දෙවියන් වහන්සේ ඉදිරියේ වැගිරවූ බවත්, බයිබලයේ සත්‍යතාවය ඔහුගේ අගනා වස්තුවක් මෙන් තබාගත් බවත් ප්‍රකාශ විය.

යාච්ඤාව සහ වචනය

ජෝර්ජ් මුලර් ද උදෑසන නිහඬ කාලයේ බයිබල් අධ්‍යයනය යාච්ඤාව සමඟ ඒකාබද්ධ කළේය. එක් කාලයකදී ඔහුගේ පුරුද්ද වූයේ උදෑසන ඇඳුම් ඇඳගත් පසු යාච්ඤාවට කැපවීමයි. පසුව ඔහුගේ සැලැස්ම වෙනස් විය. ඔහුම පැවසූ පරිදි **“මම කළ යුතු වැදගත් දෙය නම් දෙවියන් වහන්සේගේ වචනය කියවීමට සහ ඒ ගැන මෙනෙහි කිරීමට මා කැපවිය යුතු බව මම දුටුවෙමි. එවිට මාගේ හදවත සැනසීමට, දිරිගැන්වීමට හැකිවනු ඇත. ඒ අනුව දෙවියන් වහන්සේගේ වචනය තුළින් ඒ ගැන මෙනෙහි කරන අතරතුර මාගේ හදවත ස්වාමීන්වහන්සේ සමඟ අත්දැකීම් සහිත සහයෝගීතාවයකට ගෙන ඒමට හැකිවනු ඇත.”**

එබැවින් උදේ පාන්දරින්ම අලුත් ගිවිසුම ගැන මෙනෙහි කිරීමට පටන් ගතිමි. දෙවියන් වහන්සේගේ අනර්ඝ වචනය තුළින් උන්වහන්සේගේ ආශිර්වාද වචන කිහිපයක් ඉල්ලා සිටීමෙන් පසු මා කළ පළමු දෙය නම් දෙවියන් වහන්සේගේ වචනය මෙනෙහි කිරීමට පටන් ගැනීමයි. සෑම පදයක්ම සොයමින් එයින් ආශිර්වාද ලබා ගැනීම සඳහා යොමු විය. එය ප්‍රසිද්ධ දේව සේවය සඳහා නොවේ. මා භාවනා කළ දේ ගැන දේශනා කිරීම සඳහා නොවේ. ඇත්තටම එය මාගේ ආත්මයට අවශ්‍යය පෝෂණය සඳහාය. මෙහි ප්‍රතිඵලය වූයේ මම නිරන්තයෙන්ම පාහේ මේ ආකාරයෙන් දෙවියන් වහන්සේව හමු වී ඇති බවයි. විනාඩි කිහිපයකට පසුව මාගේ ආත්මය පසුතැවිලිවීමට, ස්තුති කිරීමට, මැදහත්කාරකම් කිරීමට, කන්නලව් කිරීමට යොමු වී ඇත. එම නිසා මම යාච්ඤාවට නොව භාවනාවට යොමු වූවද එය වහාම යාච්ඤාවක් බවට පත්විය. වචනය අධ්‍යයනය කිරීම හා යාච්ඤා කිරීම එකට ගමන් කරන අතර එකක් සැබවින්ම ක්‍රියාත්මක වන බව සොයා ගැනීමට හැකි තැන අනෙක සමීප සන්ධානයකින් දැකිය හැකි බව නිසැකය.

වෙහෙසකර, නොනවතින යාච්ඤාවේ වැදගත් වූ යුතුකම

නමුත් අපි නිතරම යාච්ඤා කරන්නේ නැහැ. අප අතරෙන් ගොඩක් අයට තිබෙන කරදරය එයයි. අපි යාච්ඤා කරනවාට වඩා බොහෝ කාලයක් යාච්ඤා කළ යුතුයි. පුත්‍රයෙකු, සහෝදරයෙකු, මිතුරෙකු හෝ දේවගැතිවරයෙකු ලෙස සැලකුවත් ජීවමාන ස්වරූපයෙන් මූර්තිමත් වූ සැබෑ කිතුණුවා තුළ වඩාත්ම දෝෂ රහිත හා ආකර්ෂණීය ලෙස ප්‍රකාශ විය යුත්තේ දණින් වැටී ස්වාමීන්වහන්සේ ඉදිරියේ බොහෝ කාලයක් ගතකිරීම බව රොබට් මරේ මැක්චෙන් කීවේය. මෙය ඔහු අත්දැකීමෙන් දැන සිටියේය. තවද ශුද්ධ මැදහත්කාරකමේ ප්‍රීතිය සහ වටිනාකම අන් අයගෙන් ඉල්ලා සිටීමෙන් ඔහු කිවිටෙකත් වෙහෙසට පත්වූ නැත. දෙවියන් වහන්සේගේ දරුවන් යාච්ඤා කළ යුතුය. කියා ඔහු පැවසුවේය. ඔවුන් දිවා රෑ දෙකෙහිම උන්වහන්සේට මොර ගැසිය යුතුය. දිවාභාගයේ කාර්යබහුල වේලාවන්හිදී සහ රාත්‍රියේ හුදකලා වේලාවලදී ඔබෙගේ සෑම මොරගැසීමක්ම දෙවියන් වහන්සේ අසන සේක.

ඔහුගේ දිනපොතෙන් අපට මෙය සොයාගත හැකිය. "මම උදෑසන වෙන කිසිවෙකු දැකීමට පෙර යාච්ඤා කළ යුතුය." ක්‍රිස්තුස් වහන්සේ අළුයම නැගිට හුදකලා ස්ථානයකට ගිය සේක. දාවිත් මෙසේ පැවසුවේය. "මම අළුයම ඔබව සොයන්නෙමි. ඔබ අළුයම මගේ හඬ අසන සේක. අළුයම්වෙලේ මරියා මග්දලේනා යේසුස් වහන්සේගේ සොහොන් ගෙය වෙත පැමිණියාය. දෙවියන් වහන්සේගෙන් පටන්ගෙන උන්වහන්සේගේ මුහුණ මුලින්ම දැකීම, වෙනත් දෙයකට ලංවීමට පෙර මගේ ආත්මය උන්වහන්සේ වෙතට ළඟාවීම හොඳ යැයි මට හැඟේ. මම අවදි වන විටත් මම ඔබ සමඟ සිටිමි. මම ඕනෑවට වඩා නිදාගෙන ඇත්නම්, වේලාසනින් ගමනක් යමින් සිටීනම් නැතහොත් මාගේ කාලය කෙසේ හෝ කෙටිවී ඇත්නම් සියල්ල අත්හැරීමට වඩා කඩිමුඩියේ ඇඳුම් ඇඳගෙන දෙවියන් වහන්සේ සමඟ

4පිටුවට

3පිටුවෙන්

රහසින් යාච්ඤා කිරීමේ...

මිනිත්තු කිහිපයක්වත් තනිව සිටීම හොඳය. නමුත් පොදුවේ සාමාන්‍යයෙන් වෙනත් දෙයක යෙදීමට පෙර අවම වශයෙන් පැයක්වත් දෙවියන් වහන්සේ සමඟ තනිව සිටීම වඩාත් සුදුසුය. මම දවසේ හොඳම පැය දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධතාවයට යොදාගත යුතුය. මම රාත්‍රියේ අවදිවන විට දාවිත් මෙන නැගිට යාච්ඤා කළ යුතුය.

මැක්චේන් සැමවිටම යාච්ඤාවේ සිටීම විශ්වාස කළ අතර ඔහුගේ ඵලදායී ජීවිතය අපගේ ස්වාමීන්වහන්සේ සමඟ අප හමුවීමට යන රහස් ස්ථානයට දිගු හා නිතර සංචාරය කිරීමෙන් ලැබෙන බලය පිළිබඳ ආදර්ශයක් සපයයි.

අද දින යාච්ඤාකරන පුරුෂයන් සහ ස්ත්‍රීන් අවශ්‍යව තිබේ

මැක්චේන්ගේ හමුදාවේ මනුෂ්‍යයන් අද දවසේ අවශ්‍යව තිබේ. තම කාලය සහ අවධානය ලබාදෙන ශ්‍රේෂ්ඨතම කාර්යයට තමන්වම කැපකරන්නේ කෙසේදැයි දන්නා වූ යාච්ඤා කරන මනුෂ්‍යයන්, මැදිහත්වීමේ ශුද්ධ කාර්යයට තම මුළු හදවතින්ම කැපවිය හැකි මනුෂ්‍යයන්, යාච්ඤා කළ හැකි මනුෂ්‍යයන් දෙවියන් වහන්සේගේ අරමුණට තමන්ව කැපකර ඇත. තමන්ව ඒ සඳහා භාරදෙනු ලබයි. ඔවුන් දෙවියන් වහන්සේගේ නියෝජිතයන්ය. ඔවුන් උන්වහන්සේගේ කාර්යය කරන අතර උන්වහන්සේගේ සැලසුම් ක්‍රියාත්මක කරනු ලබයි.

අපි දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ පුරවැසියන් නම් අපි යාච්ඤා කිරීමට බැඳී සිටින්නෙමු. යාච්ඤාව තම ජීවිතයේ පහළ මට්ටමකට පහත් කරන කිතුණුවා ඉක්මනින් ඔහු සතුව තිබූ ආත්මික ජ්වලිතභාවය නැතිකර ගනියි. එමෙන්ම දෙවියන් වහන්සේට යාච්ඤාවන් ස්වල්පයක් කරන දේවස්ථානයට වැදගත් භක්තිය පවත්වාගත නොහැකි අතර ශුභාරංචිය ඉදිරියට ගෙනයාමට බලයක් නැත. ශුභාරංචිය තුළ ජීවත් නොවන ක්ෂණික සහ උද්යෝගිමත් යාච්ඤාවකින් තොරව සිටින පුද්ගලයාට ආත්මිකව ජීවත්වීමට, සටන් කිරීමට, ජය ගැනීමට නොහැකිය.

මෙම යුගයේ සහ සෑම යුගයකටම සභාවේ විශාලතම අවශ්‍යතාවය වන්නේ බලවත් යාච්ඤාව තුළින් ආත්මික විප්ලවයක් ඇති කිරීමට හැකි වන පරිදි එවැනි අණදෙන ඇදහිල්ල ඇති, නොකලැල් ශුද්ධකමක් ඇති, කැපීපෙනෙන ආත්මික ශක්තියක් සහ එය පරිහරණය කරන ජ්වලිතකම ඇත් මනුෂ්‍යයන්ය.

යාච්ඤා කිරීම හරහා

ආර්.ඒ. ටෝරි විසිනි.

දෙවියන් වහන්සේ ඉදිරියෙහි ජයගෙන උන්වහන්සේගෙන් බලාපොරොත්තු වන දේ ලබා ගැනීම කෙබඳු යාච්ඤාවක්ද යන ප්‍රශ්නයට ආලෝක ධාරාවක් විහිදුවන ඡේද දෙකක් ලුක් සුභාරංචියේ තිබේ. එමෙන්ම දෙවියන් වහන්සේගේම දරුවන්ගේ බොහෝ යාච්ඤාවන්වලදී දෙවියන් වහන්සේගෙන් බලාපොරොත්තු වන පිළිතුරු ලබා ගැනීමට අපොහොසත් වන්නේ ඇයි යන ප්‍රශ්නයට ද මඟපෙන්වීමක් (අලෝකයක්) ලබාදෙයි. මෙම ඡේද දෙකෙන් පළමුවැන්න ලුක් 11:5-10 දක්වා පදවල ඔබට හමුවනු ඇත. අපගේ ස්වාමී වූ යේසුස් වහන්සේම මෙසේ පැවසූ සේක.

"තවද උන්වහන්සේ ඔවුන්ට කියන සේක්, නුඹලා අතරෙහි මිත්‍රයක් ඇති කෙනෙක් මධ්‍යම රාත්‍රියෙහි ඔහු ළඟට ගොස් මිත්‍රය, තොටි තුනක් මට ණයට දියන්න, මක්නිසාද ගමනක් යන මාගේ මිත්‍රයෙක් මා ළඟට ඇවිත් සිටියි. ඔහු ඉදිරියෙහි තබන්ට කිසිවක් මා ළඟ නැතැයි කියන්නේ නම්, ඔහු ඇතුලේ සිට උත්තර දෙමින්, මට වෙහෙස නොකරන්න, දැන් දොර වසා තිබේ. මාගේ දරුවෝ මා සමඟ නිදාගෙන සිටිති. නැගිට නුඹට දෙන්ට බැරියයි කියයිද ? නුඹලාට කියමි. ඔහු තමාගේ මිත්‍රයෙකු නිසා නැගිට ඔහුට නොදෙනත්, ඔහුගේ කන්නලවිව නිසා නැගිට ඔහුට ඕනෑ පමණ දෙන්නේ යයි කී සේක. එම ද නුඹලාට කියමි. ඉල්ලාපල්ලා, එවිට නුඹලාට දෙනු ලැබේ. සොයාපල්ලා, එවිට නුඹලාට සම්බවේ. තට්ටු කරපල්ලා, එවිට නුඹලාට දොර හරිනු ලැබේ. මක්නිසාද ඉල්ලන සියල්ලන්ට ලැබේ. සොයන්නාට සම්බවේ. තට්ටුකරන්නාට දොර හරිනු ලැබේ. " **(ලූක් 11 9-10)**

අපගේ ස්වාමීන්වහන්සේගේ මෙම උපමාවේ කේන්ද්‍රීය වූ පාඩම නම්, අපි යාච්ඤා කරන විට, අපි එය පළමුවරට ඉල්ලන විට නොලැබුණේ නම් අපි නැවත යාච්ඤා කළ යුතු බවත්, දෙවන වරටත් එය නොලැබුණේ නම්, අපි තුන්වෙනි වරටත් යාච්ඤා කළ යුතු බවත්, අපි යාච්ඤා කරන සියවෙනි වතාවේදීත් එය නොලැබුණේ නම් අපට එය ලැබනෙ තුරු යාච්ඤා කළ යුතු බවත්ය. අපි දෙවියන් වහන්සේගෙන් යමක් ඉල්ලීමට පෙර බොහෝ දේ සිතිය යුතු අතර අප ඉල්ලන දෙය උන්වහන්සේගේ කැමැත්තට අනුව බව පැහැදිලි විය යුතුය. අපි දෙවියන් වහන්සේගේ අභිමුඛයට නොසැලකිලිමත් ලෙස කාරණා ඉදිරිපත් කිරීමට ඉක්මන් නොවිය යුතු අතර අප ඉල්ලන දෙය අපට තිබිය යුතුද නැද්ද යන්න සිතීමෙන් නිසි පිළිතුරු ලබාගෙන යාච්ඤා කිරීමට තීරණය කළ පසු එය ලැබෙන තුරු යාච්ඤා කළ යුතුය.

කන්නලවි කිරීමේ වැදගත්කම

ලුක් 11:8 වන පදයේ **"කන්නලවිව"** ලෙස පරිවර්තනය කර ඇති වචනය ඉතා වැදගත් වචනයකි. එහි මූලික අර්ථය **"ලැජ්ජානැතිකම"** යන්නයි. එනම් අප ඉල්ලන දේ ලබාදීමට දෙවියන් වහන්සේගේ පැත්තෙන් කිසිඳු පැහැදිලි ප්‍රතික්ෂේප කිරීමකින් ලැජ්ජාවට පත්නොවී දෙවියන් වහන්සේට කරන යාච්ඤාව නොනවතින අධිෂ්ඨානයෙන් ඉදිරිපත් කිරීමයි. යාච්ඤාවේ දී කන්නලවි කිරීමේ සහ නොපසුබට උත්සාහයේ අවශ්‍යතාවය පැහැදිලි කිරීමට අපගේ ස්වාමීන් වන යේසුස් වහන්සේ භාවිතා කරන පුදුම සහගත ක්‍රමය මෙයයි. මෙය අප සොයන දේවල් ලබා ගැනීමට අධිෂ්ඨානශීලී නොපසුබට උත්සාහයකින්, දෙවියන් වහ්නසේගේ පැත්තෙන් ප්‍රතික්ෂේප කිරීමකින් හෝ ප්‍රමාදයකින් ලැජ්ජාවට පත්නොවන ස්තීරත්වයකින් දෙවියන් වහන්සේ අපව උන්වහන්සේ වෙතට ළං කරන බව ස්වාමීන් වන යේසුස් වහන්සේ අපට තේරුම් කර දෙන්නාක් මෙන්ය. අපගේ ස්වර්ගීක පියාණන් වහන්සේ අපගේ ශුද්ධ නිර්භීතකම ගැන සතුටු වන අතර, එය "නැත" යන පිළිතුර භාරගැනීමට සූදානම් නොවේ. උන්වහන්සේ එයට ප්‍රියවීමට හේතුව එය මහත් ඇදහිල්ලේ ප්‍රකාශනයක් වන අතර ඇදහිල්ල තරම් දෙවියන් වහන්සේව සතුටුකරන වෙනත් කිසිවක් නොමැති බැවිනි.

මතෙව් 15:21-28 දක්වා පදවල අන්‍යජාතික කාන්තාව තුළ මෙම ශුද්ධ නිර්භීතකම පිළිබඳ නිදර්ශනයක් අපට තිබේ. ඇය තම දියණියගේ සුවය සඳහා යේසුස් වහන්සේ වෙත පැමිණියාය. ඇය මොරගසමින් මෙසේ කීවාය. **"බලව කානානීය ස්ත්‍රියෙක් එහි සීමාවල සිට පිටත්ව ඇවිත්, දාවිත්ගේ පුත්‍ර වූ ස්වාමිනී මට කරුණාකළ මැනව, මාගේ දුව බලවත් ලෙස යක්ෂාවේශව සිටින්නී යයි කීවාය"** **(මතෙව් 15:22)** නුමුත් අපගේ ස්වාමීන්වහන්සේ ඇයට කිසිඳු සැලකිල්ලක් දැක් වූ බවක් පෙනුණේ නැත. මතෙව් පවසන පරිදි **"නුමුත් උන්වහන්සේ ඇයට වචනයකින්වත් උත්තරයක් දුන්නේ නැත. උන්වහන්සේගේ ගෝලයේ ඇවිත්, මෙ අප පස්සේ මොර ගසන බැවින් යන්ට හැරිය මැනවැයි උන්වහන්සේගෙන් ඉල්ලුවෝය."** (මතෙව් 15:23) උන්වහන්සේ ඇයගේ ඉල්ලීම ද්වේශ කරමින් ඇහුම්කන් නොදෙන බව පැහැදිලිව පෙනෙන්නට තිබුණ ද ඇය දිගටම මොරගසමින් සිටියාය.

ඉන්පසු උන්වහන්සේ ඇය දෙසට හැරී **"නුමුත් උන්වහන්සේ උත්තර දෙවින්, ඊශ්‍රායෙල් වංශයේ නැති වූ බැටළුවන් වෙනට විස අන්‍යයන් වෙනට මම එවනු නොලද්දෙවියි කී සේක. "** **(මතෙව් 15:24)** ඇය ඊශ්‍රායෙල් කෙනෙකු නොවූ බැවින් වඩාත් ධනාත්මකව ඇයව ප්‍රතික්ෂේප වූ බව පෙනෙන්නේය. ඉන්පසු **" ඇය උන්වහන්සේට නමස්කාරකොට , ස්වාමීනී, මට පිහිටවුව මැනවැයි කීවාය."** **(මතෙව් 15:25)** ඉන්පසුව අනුකම්පා රහිත ප්‍රතික්ෂේප කිරීමක් මෙන් පෙනෙන දෙයක් පැමිණියේ, **"උන්වහන්සේ උත්තර දෙවින් දරුවන්ගේ තොටි රගෙන බල්ලන්ට දැවීම නුසුදුසු යයි කී සේක."** **(මතෙව් 15:26)**

බල්ලන් සඳහා උන්වහන්සේ භාවිතා කළ වචනය කුඩා සුරතල් බල්ලෙකු යන අර්ථය ඇති සුවිශේෂ වචනයක් වූ අතර එය පෙනෙන තරම් රළු නොවීය. නුමුත් එය ඇගේ ඉල්ලීම ඇසීමට අකමැති බවක් පෙනුණේය. නුමුත් අපට පෙනෙන පරිදි අපගේ ස්වාමීන්වහන්සේ ඇගේ ඇදහිල්ල පරීක්ෂාවට ලක් කරමින් සිටියේ ඇයට ඊටත් වඩා ආශිර්වාදයක් ලැබෙනු ඇත යන විශ්වාසයෙනි. ඉන්පසුව ඇය මෙලෙස පැවසුවාය. **"එසේය ස්වාමීනී, බල්ලෝ පවා උන්ගේ ස්වාමිවරුන්ගේ වේසයෙන් වැටෙන කැබලි කනියි කීවාය."** **(මතෙව් 15:27)** එයින් පසුව අපගේ ස්වාමීන් වහන්සේගේ තොල් වලින් මෙතෙක් පහළ වූ වඩාත්ම අපූරු ප්‍රශංසා වචන වලින් එකක් පැමිණියේය. මතෙව් එය පවසන්නේ මෙසේය. **"එවිට යේසුස්වහන්සේ ඇට උත්තර දෙවින් ස්ත්‍රිය නුඹේ ඇදහිල්ල මහත්ය. නුඹේ කැමැත්ත ලෙසම නුඹට වේවායි කී සේක. ඒ පැයේ පටන් ඇගේ දුව සුවපත් වූවාය."** **(මතෙව් 15:28)** ඒ ආකාරයෙන් දෙයක් දෙවියන්වහන්සේට ප්‍රසන්නය. උන්වහන්සේගේ ප්‍රේමණීය කරුණාව සහ උන්වහන්සේ කෙරෙහි අපට එම ඇදහිල්ල තිබීම උන්වහන්සේට අවශ්‍ය වන්නේ උන්වහන්සේ අසන්නේ නැති බව පෙනෙන විට පවා උන්වහන්සේ තවමත් සවන් දෙන බව විශ්වාස කරන ලෙසයි.

අපි ඉල්ලන දේවල් මුලින්ම ඉල්ලන සෑමවිටම දෙවියන් වහන්සේ ඒවා ලබාදෙන්නේ නැත. නුමුත් අපි අත්නොහැරිය යුතුය. අපිට උත්තර ලැබෙන තුරු යාච්ඤා කළ යුතුය. අපි යාච්ඤා කරනවා පමණක් නොව ඒ තුළ නොකඩවා පැවතිය යුතුය. අපගේ ස්වාමීන්වහන්සේගේ ගෝලයන් ස්වාමීනී අපට යාච්ඤා කිරීමට ඉගැන්වුව මැනවයි ඉල්ලා සිටීමෙන් පසු වහාම යාච්ඤාවේ නොකඩවා රැඳී සිටීම සඳහා

5පිටුවට

4පිටුවෙන් යාච්ඤා කිරීම හරහා...

මෙම (රාත්‍රියේ පැමිණි මිත්‍රයාගේ) උපමාව පැමිණීම ඉතා වැදගත් වේ. "ස්වාමීන් වහන්සේගේ යාච්ඤාව" ලෙස හැඳින් වූ යේසුස් වහන්සේ ගෝලයන්ට ඉගැන්වූ යාච්ඤාවෙන් පසුව ලූක් සුභාරංචියේ මෙම උපමාව සඳහන් කර ඇත.

ක්ලාන්ත නොවීමට හෝ හදවතින් අත්හැර නොදැමීමට

මා දැනටමත් සඳහන් කර ඇති ලූක් සුභාරංචියේ මේ පිළිබඳව අති දෙවන උපමාව ඉතා කැපී පෙනෙන ආකාරයෙන් ඉගැන්වූ සේක. **"තවද ඔවුන් විසින් නොවැලිව නිතර යාච්ඤා කරන්ට ඕනෑ බව දක්වන පිණිස උන්වහන්සේ ඔවුන්ට උපමාවක් කියන සේක්, දෙවියන් වහන්සේට භය නැත්තා වූ, මනුෂ්‍යයන්ට ගරු නොකළා වූ විනිශ්චයකාරයෙක් එක් නුවරක සිටියේය. ඒ නුවර වැන්දඹුවක්ද සිටියාය. ඇය නොයෙක් වර ඔහු ළඟට ගොස්, මාගේ විරුද්ධකාරයා ගැන වට යුක්තිය කළ මැනවැයි කීවාය. ඔහු කලක් නොකැමති විය. පසුව ඔහු තමා තුළ කථාකොට, මම දෙවියන් වහන්සේට භය නොවෙමි. නුමුත්, මනුෂ්‍යයන්ට ගරු නොකරමි. නමුත් මේ වැන්දඹුව වට කරදර කරන හෙයින් ඇය නිතර ඒමෙන් මා නොපෙළෙන පිණිස ඇට යුක්තිය කරන්නෙමියි කීයේ යයි කී සේක. එවිට ස්වාමීන්වහන්සේ කියන සේක් මේ අධර්මිෂ්ඨ විනිශ්චයකාරයා කියන දේ අසාපල්ලා, දෙවියන්වහන්සේ තමන්ට රෑ දවල් හඬගසන්නා වූ තමන් තෝරාගත්තවුන් ගැන යුක්තිය ඉෂ්ඨ නොකරන සේක්ද ? උන්වහන්සේ ඔවුන් කෙරෙහි බොහෝ ඉවසිල්ලෙන් සිටින සේක. උන්වහන්සේ ඔවුන්ට වහාම යුක්තිය ඉෂ්ඨ කරන සේකැයි නුඹලාට කියමි. එසේවී නමුත් මනුෂ්‍යය පුත්‍රයා එන කල්හී පොළොවේ අදහිල්ල සම්බවේදැයි කී සේක."** (ලූක් 18:1-8)

මෙම උපමාවේ කේන්ද්‍රීය පාඩම කුමක්ද යන්න අපගේ ස්වාමීන් වන යේසුස් වහන්සේ උපමාව ආරම්භ කරන වචන වලින් අපට සොයාගත හැකි අතර ඒවා සැබවින්ම මුළු උපමාවේම තේමාවයි. මෙම වචන එනම් "ඔවුන් නිතරම යාච්ඤා කළ යුතුයි." "ක්ලාන්ත නොවිය යුතුයි." මේවායේ අර්ථය නම් අපි යාච්ඤා කිරීමට පටන් ගන්නා විට දෙවියන් වහන්සේගෙන් අප ඉල්ලන දේ ලැබෙන තුරු නැවත නැවතත් යාච්ඤා කළ යුතු බවයි. නියම බලය නම් අධර්මිෂ්ඨ විනිශ්චයකාරයෙකු පවා නොනවත්වා කරන කන්නලව්වට යටත්වී තමා දීමට අකමැති දේ ලබාදෙන්නේ නම්, ප්‍රේමණීය දෙවියන් වහන්සේ තම දරුවන්ගේ නොවත්වා කරන යාච්ඤාවට කොපමණ වැඩියෙන් පිළිතුරු ලබාදෙන්නේ ද ? උන්වහන්සේ තම දරුවන්ගේ ඉල්ලීම් ලබාදීමට සෑමවිටම ආශා කරන නමුත් ඔවුන්ට අයහපත්ව තිබෙන දේ ලබා නොදන සේක. නොනවතින ඇදහිල්ලකට පුහුණු කිරීම සඳහා එම පුද්ගලයාගේම යහපත උදෙසා එය ලබා නොදන සේක.

එකවරකට වඩා ඉල්ලා සිටීමට හේතුව

අප ඉල්ලන දේවල් පළමු වතාවේදීම දෙවියන් වහන්සේ අපට ලබා නොදෙන්නේ ඇයි ? පිළිතුර පැහැදිලිය. දෙවියන්වහන්සේ අපට ඒ දේ පමණක් නොව තවත් බොහෝ දේ ලබාදීමට නොනවතින ඇදහිල්ලට අපව පුහුණු කිරීමෙන් උන්වහන්සේ අපට බොහෝ සෙයින් යහපත කරනු ඇත. අපගේම යහපත සඳහා නොපසුබට උත්සාහයේ පැවතීමට අපව යොමුකරන සේක. ඒ තුළින් අපව ශක්තිමත් පුරුෂයන් සහ ස්ත්‍රීන් බවට පත්කරන සේක. හොඳම දේ අපට "යාච්ඤා කරන්න" කියා පොළඹවනු ලබන සේක.

නිසැකවම වචනය කෙරෙහි ඇදහිල්ලෙන් හෝ ශුද්ධාත්මයාණන් වහන්සේගේ පහැදිලි මඟපෙන්වීම තුළින් අපි දෙවියන් වහන්සේගෙන් පළමුවරට යමක් ඉල්ලන විට එය ඉල්ලා සිටීමට අපට අවස්ථාව තිබේ. කෙසේ වෙතත් පිළිතුරු ලැබෙනතෙක් එකම දෙය උදෙසා නැවත නැවත යාච්ඤා කළ යුතු අවස්ථා තිබේ. යේසුස් වහන්සේ එලෙස කළ බව දේව වචනයේ අපට පැහැදිලිව පවසා ඇත. **"නැවතත් උන්වහන්සේ ඔවුන් අතහැර ගොස්, තුන්වෙනි වරත් ආයෙත් එම වචන කියා යාච්ඤා කළ සේක."** (මතෙව් 26:4) එක පාරක් හෝ දෙපාරක් ඉල්ලා යාච්ඤා කර එය නතර කරන අය බොහෝ දෙනෙක් සිටිති. පළමුවෙනි වර හෝ දෙවෙනි වර ඉල්ලා නොලැබුණාත් ඒ පිළිබඳව යාච්ඤා නොකරන්න. සමහර විට එය ලබාදීම දෙවියන් වහන්සේගේ කැමැත්ත නොවේ යැයි කියමින් එය දෙවියන් වහන්සේගේ කැමැත්තට යටත්වීම කියලා කියන අය සිටිනවා.

නමුත් රීතියක් ලෙස මෙය දෙවියන් වහන්සේගේ කැමැත්තට යටත්වීමක් නොවේ. එය සියලු මිනිස් උත්සාහයන්ගෙන් වඩාත් වැදගත්ම දෙය වන යාච්ඤාව තුළ ආත්මික අලසකම සහ අධිෂ්ඨානය නොමැතිකමයි. යාච්ඤාව හැර අපගේ අනෙකුත් උත්සාහයන් මගින් දේවල් ලබා ගැනීමට උත්සාහ දරණ විට වරකට හෝ දෙවරකට පසු අපි අත්හරින විට එය දෙවියන් වහන්සේගේ කැමැත්තට යටත්වීම ලෙස හැඳින්වීමට අපගෙන් කිසිවෙකු කිසි විටෙකත් සිතන්නේ නැත. එවැනි අවස්ථාවලදී අප එය චරිතයේ, ශක්තියේ, ගුණතාවයක් ලෙස හඳුන්වන්නෙමු. ක්‍රියාශීලී ශක්තිමත් මනුෂ්‍යයෙක් දෙයක් ඉටුකිරීමට පටන් ගත්විට ඔහු එය පළමු, දෙවෙනි හෝ සියවෙනි වතාවේදීත් ඉටු නොවූයේ නම් එය ඉටුවන තෙක් පොර බඳිමිනි සිටියි. එසේම යාච්ඤාවේ ශක්තිමත් මනුෂ්‍යයා ඔහු යමක් සඳහා යාච්ඤා කිරීමට පටන් ගත් විය. ඔහු ඉල්ලන දේ ලබාගන්නා තෙක් යාච්ඤාවේ යෙදී සිටියි.

අපගේ හැසිරීම්වල නරක දේවල් හොඳනම් වලින් හැඳින්වීමට අපි කොයිතරම් කැමතිද ? අපගේ ආත්මික අලසකම, කම්මැලිකම, උදාසීනත්වය දෙවියන් වහන්සේගේ කැමැත්තට යටත්වීම ලෙස හඳුන්වන්නේ කෙසේද ? අපි දෙවියන් වහන්සේගෙන් ඉල්ලන දේ ගැන ඉතා සැලකිලිමත් විය යුතුය. නමුත් යමක් සඳහා යාච්ඤා කිරීමට පටන් ගත්විට අපට එය ලැබෙන තුරු හෝ දෙවියන් වහන්සේ එය ලබාදීම උන්වහන්සේගේ කැමැත්ත නොවන බව අපට පැහැදිලිව පවසන තුරු අපි කිසිවිටෙකත් ඒ සඳහා යාච්ඤා කිරීම අත්නොහැරිය යුතුය. අපි උන්වහන්සේගෙන් ඉල්ලන දේවල් අපි ඉල්ලන පළමු වතාවේදීම දෙවියන් වහන්සේ සෑමවිටම ලබා නොදීම ගැන මම සතුටු වෙමි. දෙවියන් වහන්සේගෙන් ඉල්ලන දේ ලබා ගැනීමට පෙර වසර ගණනාවක් පුරා නැවත නැවතත් ඉල්ලා සිටීමට යොමු කිරීමෙන් ලැබෙන පුහුණුවට වඩා යාච්ඤාවේ තවත් ආශිර්වාදලත් පුහුණුවක් නොමැත. එවිට එය පැමිණි විට දෙවියන් වහන්සේ සැබවින්ම සිටින බවත්, දෙවියන් වහන්සේ සැබවින්ම යාච්ඤාවට පිළිතුරු ලබාදෙන බවත් අපට හැගෙන්නේය.

පිබිදීම අභියස සිටියදී අත්හැරීම

සමහර විට යාච්ඤා කරමින්, අපි යාච්ඤා කරන දේ සාක්ෂාත් කර ගැනීමේ සීමාව අද්දරට පැමිණ ඇත. ඒ මොහොතේම දෙවියන් වහන්සේ යාච්ඤාවට පිළිතුරු ලබාදීමට ආසන්න වන විට අපි නතර වෙන අතර අපට ආශිර්වාදය මඟහැරේ. නිදසුනක් වශයෙන් බොහෝ දේවස්ථානවල සහ බොහෝ ප්‍රජාවන්හි පිබිදීමක් උදෙසා යාච්ඤා කරන අය සිටින අතර පිබිදීම එකවරම පැමිණෙන්නේ නැත. එය යම් කාලයක් සඳහා නොපැමිණෙන අතර ඔවුන් නිතරම යාච්ඤා කරමින් සිටියද, ඔවුන් යාච්ඤා කර අවසන්වීමට ආසන්නව සිටියදී ඔවුන් සොයන දේ සාක්ෂාත් කරගැනීමේ අද්දර සිටින අතර තව ටිකක් යාච්ඤා කළහොත් පිබිදීම ඔවුන් අතරට පැමිණෙනු ඇත. නමුත් ඔවුන් අධෛර්යමත් වී දැත් ඔසවා ඉවත්ව යයි. ඔවුන් ආශිර්වාදයේ මායිමේ සිටින නමුත් ඔවුන් පොරොන්දු දේශයට ඇතුළත් නොවේ.

ක්‍රිව. 1900 ජනවාරි මාසයේ දී හෝ 1901 චිකාගෝ බයිබල් ආයතනයේ ගුරු මණ්ඩලයදී සෙනසුරාදා රාත්‍රී නවයේ සිට දහය දක්වා ප්‍රමාද වූ යාච්ඤා රැස්වීමක් ආරම්භ කළේ ලෝක ව්‍යාප්ත පිබිදීමක් සඳහා යාච්ඤා කිරීමටයි. අපි ටික වේලාවක් යාච්ඤා කිරීමෙන් පසු අපි ආරම්භ කරන විට සිදුවනු ඇතැයි මා දැන සිටි දෙයක් සිදුවිය. මෙම රැස්වීම පැවැත්වීමේදී මා සමඟ වඩාත් සමීපව හඳුනාගත් මනුෂ්‍යයන් වෙත හෝ මාගේ සඟයා වෙත පැමිණි අතර ඔවුන් මෙසේ සංවාදයේ යෙදුණේය. පිබිදීම පැමිණ තිබේද ? නැහැ. නමුත් එය අපට නොපෙනෙන තරම් දුර නොවේ. කවදාද එන්නේ අපි දන්නේ නැහැ.

ඔයා කොච්චර වේලාවක් යාච්ඤා කරනවදා ? එනකම්ම. එය ඒ වාගේම සිදු විය. චිකාගේ බයිබල් ආයතනයේ යාච්ඤා රැස්වීම් කාමරයෙන් ආරම්භ වූ පිබිදීම පසුව චීනය, ජපානය, ඕස්ට්‍රේලියාව. නවසීලන්තය, තස්මේනියාව සහ ඉන්දියාව යන රටවලත් පැතිරී ගොස් දෙවියන් වහන්සේගේ ගැලවීමේ බලය විශ්මයජනක ප්‍රකාශයන් සමගින් ඇලෙක්සැන්ඩර් මහතා සහ මා හරහා පමණක් නොව තවත් බොහෝ දෙනා හරහා ලොව පුරා පැතිරී ගියේය. ඉන්දියාවේ වේල්සයේ සහ වෙනත් තැන්වල තවත් බොහෝ දෙනෙකු හරහා පැතිරී ගියෝය. උදාහරණයක් ලෙස වේල්සයේ ඊවන් රොබට්ස් සහ අනෙකුත් අය යටතේ මාස දොළහක් තුළ ලක්ෂයක් ඉස්ලාම් අය ගැලවීමට පැමිණියෝය. ඒ වාගේම දෙවියන් වහන්සේ අපි යාච්ඤා කරනකම් බලාගෙන සිටින බව මම විශ්වාස කරන්නෙමි.

ආදරණීයයන් වෙනුවෙන් දිගටම යාච්ඤා කරන්න

මගේ වැඩිමහල් සහෝදරයාගේ හැරීම සඳහා මම අවුරුදු පහළවක් පුරා යාච්ඤා කළෙමි. ඔහු ගැලවීම වෙතට පැමිණීමේ බලාපොරොත්තුවෙන් සිටියත් බොහෝ දුරස් වෙමින් සිටින බව පෙනෙන්නට විය. නමුත් මම යාච්ඤා කළෙමි. එක් උදෑසනක චිකාගෝ හී මගේ පළමු ශීත කාලය තුළ දී වසර පහලොවක් යාච්ඤා කිරීමෙන් පසු මම දණ ගසා යාච්ඤා කරන විට දෙවියන් වහන්සේ මට මෙලෙස පැවසූ සේක. මම ඔබේ යාච්ඤාව අසා ඇත්තෙමි. ඔබේ සහෝදරයා ගැලවීම වෙතට හැරී ඒමට නියමිතයි. සති දෙකක් ඇතුළත මාගේ සහෝදරයා අසනීපවෙලා මගේ ගෙදර සිටියේය. අසනීප නිසා එයාට යන්න බැරිවුණේය. ඊට පස්සේ බයිබල් ආයතනයේ මූඩි මහතාගේ කාර්යාලයට ඔහුත්, මමත් එක්ව යාච්ඤා කරන පිණිස ගිය දවසේම ඔහු ක්‍රිස්තුස් වහන්සේව පිළිගනු ලැබුවේය.

මම එක්තරා නගරයක රැස්වීම් පවත්වමින් සිටියදී මේ සිද්ධිය පැවසුවෙමි. රැස්වීම අවසානයේ දී වයෝවෘද්ධ කාන්තාවක් මා වෙත පැමිණ මෙසේ පැවසුවාය. මම වයස අවුරුදු හැට තුනක් වයසැති මගේ සහෝදරයා ගැලවීම වෙතට හැරෙන පිණිස වසර ගණනාවක් යාච්ඤා කරමින් සිටියෙමි. නමුත් ටික කාලයකට පෙර මම යාච්ඤාව අත්හැර දැමුවෙමි. නමුත් මම නැවත එය ආරම්භ කරන්නෙමි. ඒ කාලයේ සති දෙකක් ඇතුළත ඇය මා වෙත පැමිණ මට මාගේ සහෝදරයාගෙන් දැනගන්නට ලැබුණා ඔහු ක්‍රිස්තුස් වහන්සේව පිළිගත්තා කියා, සහෝදරයෙණි. යාච්ඤා කරන්න, නොකඩවා යාච්ඤා කරන්න, ටික වේලාවක් යාච්ඤා කර ප්‍රශංසා කිරීමට පටන් ගෙන ඔබේ දැත් ඔසවා එය නොනවත්වා කරන්න. දෙවියන්වහන්සේ අහස පළාගෙන පහළට එනතුරු යාච්ඤා කරන්න.

"මේ සියල්ලෝම එක්සිත්ව නොකඩවම යාච්ඤාකරමින් සිටියෝය. " (ක්‍රියා 1:14)

දිනපතා සෙවිය යුතු ආශිර්වාද

ජේම්ස් ස්මිත් විසිනි. 1802-1862

අපට දිනපතා බොහෝ සහ මහත් වූ ආශිර්වාද අවශ්‍ය වන අතර කරුණාවේ සිංහාසනය වෙතට පැමිණ අපට ඒවා ඉල්ලා සිටීමට සහ ලබා ගැනීමට හැකිය. අපට අවශ්‍ය සියල්ල යේසුස් වහන්සේ තුළ වන අතර යේසුස් වහන්සේ තුළ ගබඩාකර ඇති සියල්ල අප වෙනුවෙන් වේ. නමුත් අපට අවශ්‍ය පරිදි ඒවා සෙවීමට පෙර අපි ආත්මික අනුග්‍රහයේ වටිනාකම ඉගෙනගත යුතුය. ඒවා ලබා ගැනීමට අපේක්ෂා කිරීමට පෙර ස්වාමීන් වහන්සේ නියමකර ඇති ආකාරයෙන් ඒවා සෙවිය යුතුය. උන්වහන්සේ මෙසේ ප්‍රකාශ කළ සේක. "ඉල්ලාපල්ලා, එවිට නුඹලාට දෙනු ලැබේ. සොයාපල්ලා, එවිට නුඹලාට සම්බවේ. තට්ටුකරපල්ලා එවිට නුඹලාට දොරහරිනු ලැබේ. (මතෙව් 7:7) එසේ නම් අපි උන්වහන්සේගේ සිංහාසනයට ළඟාවෙමු. උන්වහන්සේ කරුණාවන්ත වන සේකැයි අපේක්ෂා කරමු. උන්වහන්සේගේ අත්වලින් යහපත් දේවල් හතක් දෙස බලමු.

1. ඇදහිල්ල :- මෙය මහත් ආශිර්වාදයකි. මක්නිසාද එය අනෙකුත් සියලු ආශිර්වාදවල පූර්වගාමියාය. ඇදහිල්ල ඇති තැනැත්තාට ජීවිතයට දේව භක්තියට අවශ්‍ය සියල්ල ලබාගත හැකිය. සැබෑ ඇදහිල්ල ලෝකයෙන් ජයගනී. ප්‍රේමයෙන් ක්‍රියා කරයි. හදවත පවිත්‍ර කරයි. එය පිබිදීමේ සාක්ෂියයි. සදාකාල ජීවනයේ ආරම්භය සහ සියලු යහපත් ක්‍රියාවල මූලාශ්‍රයයි. ඇදහිල්ල දෙවියන් වහන්සේගේ පොරොන්දු ගෞරවයට පාත්‍රකරයි. (විශ්වාස කරයි) වැලඳගනු ලබයි. ආයාචනා කරනු ලබයි. ස්වාමීන් වන යේසුස් වහන්සේව තේරුම්ගනු ලබයි. උන්වහන්සේව පිළිගනු ලබයි. තදින් ග්‍රහණය කරගනු ලබයි. දෙවියන් වහන්සේගේ සම්පූර්ණ යුදායුධ පැළඳගනු ලබයි. ස්වාමීන්වහන්සේගේ නාමයෙන් සහ ශක්තියෙන් ආරම්භ වේ. ඇදහිල්ල සෑම සතුරෙකුගෙන්ම ජයගනී. එය ස්වාමීන්වහන්සේ කෙරෙහි බලා සිටියි. පොරොන්දු අයැද සිටියි. අවශ්‍ය සෑම ආශිර්වාදයක්ම ආත්මයාණන් වහන්සේ විසින් ගෙන එනු ලබයි. ඇදහිල්ල බිය යටපත් කරයි. සැකය පොඩිකර දමනු ලබයි. ආත්මය ප්‍රීතියෙන් හා සමාදානයෙන් පුරවනු ලබයි. අඳුරේදීත් ගමන් කරනු ලබයි. කණස්සල්ල ඇති අවස්ථාවේදීත් විශ්වාස කරනු ලබයි. සෑමවිටම ස්වාමීන්වහන්සේ සහ උන්වහන්සේගේ කටයුතු පිළිබඳව හොඳ අදහසක් ඇති කරනු ලබයි. **"ස්වාමීනී, මට මෙම ඇදහිල්ල කෘඪාණුකොටගෙන බොහෝ දේ ලබාදෙන්න."**

2. යහපත් බලාපොරොත්තුව :- මෙය ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන නිපදවනු ලබන අතර උන්වහන්සේගේ කරුණාවෙන් පැණනගින්නේය. එය හිමිකරගන්නා වූ අයව ලැජ්ජාවෙන් ආරක්ෂා කරනු ලබයි. එය යහපත් දේ කෙරෙහි අවධානය යොමු කරනු ලබයි. අනාගතය කෙරෙහි දැස් රඳවා තබා ගැනීමට හැකියාව ලබාදෙයි. එමෙන්ම කණස්සල්ලෙන් සහ බලාපොරොත්තු සුන්වීමෙන් මුදාගනු ලබයි. යහපත් බලාපොරොත්තුව ආත්මයට නැංගුරමක් වන අතර එය නිසැකකමක් සහ නොසැලෙන බවක් ලබාදෙයි. එය කරුණාවේ (දයාවේ) භාජනය සාගරයේ සෝෂාකාරී බව තුලවත්, නොගැඹුරු දියේදීවත්, එරෙන වැල්ලේවත්, ජලය යට පවතින පාෂාණ අතරවත් ගිලෙන්නට ඉඩ නොදෙයි. එය තිරය මත සවිකර සදාකාල සිංහාසනයේ රඳවා තබන්නේය. එය ක්‍රිස්තුස් වහ්නසේ තුළ කේන්ද්‍ර වී පොරොන්දුව මත රැඳී තිබේ. මහිමය, ගෞරවය, අමරණීයභාවය අපේක්ෂා කරයි. ස්වාමීනී, කරුණාව තුලින් මට යහපත් බලාපොරොත්තුවක් ලබා දී ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් මාව බලාපොරොත්තුවෙන් බහුල කිරීමට සලස්වන්න.

3. ත්‍යාගශීලීබව :- දෙවියන් වහන්සේගේ ත්‍යාග ශීලී බව කිසිදා ආසාර්ථක වන්නේ නැත. දෙවියන් වන්නසේගේ ප්‍රේමය අපගේ හදවත්වල වගුරුවා අපව උන්වහන්සේට ප්‍රේම කිරීමටත්, උන්වහන්සේට ප්‍රේම කරන සියල්ලන්ට ප්‍රේම කිරීමටත් මඟ පෙන්වයි. දෙවියන් වහ්නසේගෙන් පැමිණෙන ත්‍යාග ශීලී බව උන්වහන්සේ තුළ කේන්ද්‍රවී ඇත. අපව දෙවියන්වහන්සේ වෙතට මෙහෙයවා එය හිමිකර ගැනීමට මඟපෙන්වයි. මෙම ශුද්ධ වූ ස්වර්ගික ත්‍යාශීලී බව මෙන් ශුද්ධකමට එතරම් ප්‍රේමකරන, ස්වාමීන් වහන්සේගේ මහිමය සඳහා එතරම් ජ්වලිතකමක් ලබාදෙන හෝ ස්වාමීන් වහන්සේගේ අරමුණට අපව කැප කරන කිසිවක් නැත. එය දිව්‍යමය ස්වභාවයෙන් හටගෙන මැදහත්කරුවන්ගේ හදවත හරහා ගලා යයි. එය අපගේ හදවත්වල ශුද්ධාත්මයාණන් වහන්සේගේ මෙහෙය වන අතර එය දිව්‍ය චරිතයේ ප්‍රමුඛ ලක්ෂණයයි. එය කිසිවිටෙකත් දෙවියන් වහන්සේව සතුටු කිරීමට, මනුෂ්‍යයන්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා එය හිමිකරගෙන සිටින පුද්ගලයාව සතුටු කිරීමට අසමත් විය නොහැකිය. එය එහි ස්වභාවයෙන් අමරණීයයි, එහි ක්‍රියාකාරිත්වයෙන් බලවන්තයි. ප්‍රතිලාභයෙන් තේජාන්විතයි. **"ස්වාමීනී, මාගේ හදවත ශුද්ධ ස්වර්ගීය ප්‍රේමයෙන් පුරවන්න."**

4. නිහතමානීකම :- මෙය ඉතාමත්ම වටිනා කාරණාවකි. මම කවදාවත් දැක නැති තරම් අලංකාරය, ආදරය සහ මහිමය එහි දකිමි. ගැලවුම්කරුවාණන් සෑමවිටම පැළඳ සිටි ඇඳුම මෙයයි. උන්වහන්සේ කළා වූ සහ පැවසුවා වූ සියල්ලටම එවැනි චමත්කාරයක් ලබා දුන් කරුණාව මෙයයි. එය අපගේ හොඳම ඇඳුම්වලින් එකකි. එය නොමැතිව ආත්මය නිරුවත්ව පවතියි. (1 ප්‍රේත්‍රුස් 5:5) මෙය නොමැති නිසා සභාව අභ්‍යන්තර බෙදීම්වලින් ඉරා දමා ඇත. ඇදහිලිවන්තයන් බොහෝ පරීක්ෂාවන් සහ කුරුස තමන් මතට ගෙන එයි. එයින් කරදර සහ දුක්විඳීමේ කටුක බීජ වපුරවයි. මම සැබවින්ම නිහතමානී නම් මම සතුටු විය යුතුය. මක්නිසාද එවැනි අය සමඟ දෙවියන් වහන්සේ වාසය කරන සේක. (යොසායා 57:15) උන්වහන්සේ එවැනි අය දෙස ආදරය, ප්‍රීතිය සහ තෘප්තියෙන් බලයි. (යොසායා 66:2) උඩඟුකම දෙවියන් වහන්සේට ඉතාමත් පිළිකුල් සහගතය. මනුෂ්‍යයන්ට හානිකරය. එය අප තුළ සාතන්ගේ බලකොටුවකි. දෙවියන් වහන්සේ උඩඟු අයට විරුද්ධව සිටින සේක. (යාකොබ් 4:6) උන්වහන්සේ ඔවුන්ව දුරින් තබන අතර තමන්වහන්සේ වෙතට ළඟාවීමට ඉඩ නොදෙන සේක. (ගීතාවලිය 88:6) උන්වහන්සේ ඔවුන්ට සදාකාලික විනාශයෙන් තර්ජනය කරන සේක. "ස්වාමීනී, මට සැබෑ නිහතමානීකම ලබාදෙන්න. මාව දිනෙන් දින එයින් සරසවන්න. "

5. දෙවියන් වහන්සේගේ කැමැත්තට යටත්වීම :- පුරුද්දක් ලෙස දෙවියන් වහන්සේගේ කැමැත්තට යටත්වීම යහපත් දෙයකි. මක්නිසාද සියලුම කාරණාවලදී සහ සියලුම ස්වභාවයන් කෙරෙහි උන්වහන්සේගේ කැමැත්ත අපගේ වන්නේය. මෙය එසේ නම් අපි සතුටු විය යුතුය. මන්ද කිසිම දෙයකින් අපට බොහෝ සෙයින් පීඩා කළ නොහැකි අතර දිගු කාලයක් අපව පීඩාවට පත් කළ නොහැකි බැවිනි. නමුත් අපි බොහෝ විට අපගේම කැමැත්ත සොයමින් අපගේම මාර්ගයේ ගමන් කිරීමට උත්සාහ කරන අතර එය දෙවියන් වහන්සේගේ කැමැත්තට එකඟ ද යන්න සලකා බලන්නේ නැත. උන්වහන්සේගේ කැමැත්ත ප්‍රඥාවන්ත විය යුතුය. මක්නිසාද උන්වහන්සේ ප්‍රඥාවන්ත දෙවියන් වහන්සේ වන සේක. එය යහපත් විය යුතුය. මන්ද උන්වහන්සේ ප්‍රේමයයි. එය ධර්මිෂ්ඨ විය යුතුය. මන්ද උන්වහන්සේ සියලු මාර්ගවලින් ධර්මිෂ්ඨ වන අතර උන්වහන්සේ සියලු ක්‍රියාවලින් ශුද්ධය. උන්වහන්සේගේ නාමය මහිමයට පත්කරන, උන්වහන්සේගේ සෙනඟට ප්‍රයෝජනවත්වෙන සහ උන්වහන්සේගේ සතුරන් නිහතමානීව කරන දේවලට පමණක් උන්වහන්සේ කැමති වේ. **"දෙවියන් වහ්සේගේ කැමැත්තට යටත්වීම ගැන මගේ ලෞකික මනස දමනය කෘඪනු ලැබේවා. මගේ මුළු ආත්මය දෙවියන් වහන්සේගේ කැමැත්තට නිතැතින්ම හා විහිරි යටත්වීමේ තත්ත්වයකට ගෙන එනු ලැබේවා "**

6. ක්‍රිස්තුස් වහන්සේගේ දැන ගැනීම තුළ ප්‍රඥාවේ හා එළිදැරවි කිරීමේ ආත්මය (එළිදැරවි 1:17) :- මෙය අපට ගැඹුරින් අවශ්‍ය වන අතර අපි දිනපතා මෙය සෙවිය යුතුය. අප තවමත් ක්‍රිස්තුස් වහන්සේ ගැන දන්නේ ඉතා ස්වල්ප වශයෙනි. අපට අවශ්‍ය වන්නේ ආශිර්වාදලත් සැනසිලිකරුවාණන් වහන්සේගේ පුද්ගලික මහිමය, උන්වහන්සේගේ චරිතයේ අලංකාරය, උන්වහන්සේගේ කාර්යයේ සුදුසුකම, උන්වහන්සේගේ හදවතේ ප්‍රේමය, උන්වහන්සේගේ රුධිරයේ විශිෂ්ඨත්වය, උන්වහන්සේගේ කරුණාවේ නිදහස් බව, උන්වහන්සේගේ අනුග්‍රහයේ ගැඹුර, උන්වහන්සේගේ අනුකම්පාවේ මෘදු බව, උන්වහන්සේගේ කීකරුකමේ ගෞරවය, උන්වහන්සේගේ තනතුරුවල පරිපූර්ණත්වය හා නොබිඳිය හැකි බවේ (නිමානොවන බවේ) ස්වභාවය අපට තවත් හෙළිකරණු ලැබීම දැකීමටය. **"උන්වහන්සේව දැන ගැනීමට උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලය අපට ලබාදී උන්වහන්සේගේ මරණයට සමානවීමට උපකාර කරන සේක්වා. ශුද්ධාත්මයාණෙනි, එම කාර්යයන් තුළින් යේසුස් වහන්සේව අනාවරණය කර ගැනීමට උන්වහන්සේට මහිමය ලබාදීමට, අපට උන්වහන්සේව හෙළිදරව් කළ මැනව. අප තුළ ප්‍රඥාවේ හා හෙළිදරව් කිරීමේ ආත්මය වුව මැනව. එවිට අපට ක්‍රිස්තුස් වහන්සේව සම්පූර්ණයෙන්ම දැන ගැනීමටත්, උන්වහන්සේට හදවතින්ම ප්‍රේම කිරීමටත්, ශරීරයෙන්, ආත්මයෙන් හා මනසින් උන්වහන්සේව මහිමයට පත්කිරීමටත් හැකිවනු ඇත. උන්වහන්සේව තව තවත් දැන ගැනීමට, උන්වහන්සේව තව තවත් විශ්වාස කිරීමට, උන්වහන්සේව තව තවත් අනුකරණය කිරීමට, උන්වහන්සේට තව තවත් ප්‍රේම කිරීමට සහ විනාශ වෙන පව්කාරයන්ට උන්වහන්සේව සෑහෙන බව සහනික කිරීමට හැකිවනු ඇත. "**

7. පාවිච්චි කළ හැකි :- නිශ්චල ජීවිතයක් ගත කළ හැකි එසේ නොමැති නම් ලබාගත් ඕනෑම ප්‍රයෝජනවත් බවකින් සෑහීමකට පත්විය හැකි හදවතක තත්ත්වය කුමක් විය යුතද ? පව්කාරයන්ට. ශුද්ධවන්තයන්ට, තරුණයන්ට සහ මහළු අයට ප්‍රයෝජනවත්වීමට හැකිවන්නා වූ ප්‍රයෝජනයක් ඇති ජීවිතයක් කිතුණු ධර්මයේ ආභරණයයි. සුභාරංචිය සෑමවිටම අපට යහපත කිරීමට සහ එය සන්නිවේදනය කිරීමට උගන්වයි. අපි ප්‍රයෝජනවත්වීමට සුදුසු කාරණා සොයමු. එය අත්පත් කර ගැනීමට සහ එය වගා කිරීමට අපගේ උත්සාහයන් තුළ අපගේ ශ්‍රමය සාර්ථක කර දෙන කරුණාව අපට ලබාදෙන ලෙස ස්වාමීන්වහන්සේගෙන් ඉල්ලා සිටිමු. කරුණාව එහි අවසානය ලෙස මහිමයට මඟපෙන්වන අතර සෑමවිටම අපව ප්‍රයෝජනවත් අය බවට පත්කරනු ලබයි. අපට බෙහෝ කරුණාව තිබේ නම් අපි කිසි විටෙකත් සෑහීමකට පත්නොවන නමුත් අපි දෙවියන් වහන්සේව මහිමයට පත්කරන විට උන්වහන්සේගේ කැමැත්ත කිරීමෙන් හෝ දුක්විඳීමෙන් අපට වැඩි කරුණාවක් ඇති තරමට දෙවියන් වහන්සේව මහිමයට පත්කිරීමට සහ අප වටා සිටින සියල්ලන්ට ප්‍රයෝජනවත්වීමට අපි වැඩි පිපාසයක් දක්වන්නෙමු. මනුෂ්‍යයෙක්ට නිශ්ඵල දවසක් ගතකිරීමට කැමැත්තෙන් සිටිය හැකි බව හෝ ඔහු සෙසු මනුෂ්‍යයන් ගැන නොසැලකිලිමත් ලෙස සිටීමට හැකි බව තුලින් සෑමවිටම ඔප්පු කරනු ලබන්නේ ඔහු ආත්මික වශයෙන් පහත් තත්ත්වයක සිටින බවයි.

ප්‍රේමවන්තයෙනි, දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ල තබා ගැනීමටත්. දෙවියන් වහන්සේව මහිමයට පත්කරන ඇදහිල්ලෙන් ශක්තිමත්වීමටත්, දිනපතා දෙවියන් වහන්සේගෙන් "ඇදහිල්ල" සොයමු. ජීවිතයේ සියලු කරදර සහ පරීක්ෂා මධ්‍යයේ දෙවියන් වහන්සේගේ දයාව කෙරෙහි ජීවමාන, ජවසම්පන්න **"බලාපොරොත්තුවක්"** ඇති කර ගැනීමට අපි උත්සාහ කරමු. ප්‍රේමයේ දෙවියන් වහන්සේගෙන් ශුද්ධ වූ ත්‍යාගශීලී **"ප්‍රේමය"** සොයමු. මන්ද අපට හිමි ඕනෑම දෙයක්, අප කරන ඕනෑම දෙයක් හෝ අපට දුක්විඳීමට සිදුවන ඕනෑම දෙයක් තුළ දී අපට ත්‍යාග ශීලීව කටයුතු කිරීමට නොහැකි නම් එයින් කිසිඳු ප්‍රයෝජනයක් නැත. දෙවියන් වහන්සේ ඉදිරියේ යටහත්වී දෙවියන් වහන්සේගේ කැමැත්තෙන් ඉහළට ඔසවනු ලැබ දෙවියන් වහන්සේ විසින් උසස් කරනු ලබන පිණිස ගැඹුරු **"නිහතමානීකම"** සොයමු. දෙවියන් වහන්සේගේ බලවත් හස්තයට යටත්වෙන්න. එවිට උන්වහන්සේ නියමිත කාලයේ දී ඔබව උසස් කරනු ඇත. බයිබලයෙන් අනාවරණය කරන, දේව ආරක්ෂාවෙන් අනාවරණය කරන දෙවියන් වහන්සේගේ මුළු කැමැත්තට **"යටහත්වීම"** සහ එකඟවීම සොයමු. ක්‍රිස්තුස් වහන්සේව නිවැරදිව, අත්දැකීම් සහිතව සහ වැඩියෙන් දැන

7 පිටුවට

"උන්වහන්සේ තමන් කෙරෙහි භය ඇත්තන්ගේ ආශාව ඉෂ්ඨ කරදෙන සේක , (ගීතාවලිය 145:19)

6 පිටුවෙන්

දිනපතා සේවය යුතු...

ගැනීමට හැකි වන පරිදි **"ප්‍රඥාවේ සහ එළිදැරවීමේ ආත්මය"** ලෙස ශුද්ධාත්මයාණන් වහන්සේව සොයමු. එබැවින් අපි උන්වහන්සේගේ නාමය විශ්වාස කරමු. උන්වහන්සේගේ පූජාව මත රඳා සිටිමු. උන්වහන්සේගේ කරුණාවෙන් ප්‍රීතිවෙමු. ලෝකයේ සහ සභාවේ ප්‍රයෝජනය සඳහා වඩා වඩා **"ප්‍රයෝජනවත්වීමට"** උත්සාහ කරමු. දෙවියන් වහන්සේ වඩා පහත් සහ ලෝකයේ අණුවන දේවල් පාවිච්චි කරන සේක. බොහෝ විට උන්වහන්සේගේ අරමුණු ඉටුකර ගැනීම සඳහා උන්වහන්සේගේ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා යහපත් චේතනාවකින් ප්‍රයෝජනවත්වීමට මෙලෙස තෝරාග න්නා සේක . එවිට ගෞරවය වෙන කිසිවෙකුට නොව දෙවියන්වහන්සේට පමණක් වන සේක. සාමාන්‍යය ආත්මික සහ කැපවූ ඇදහිලිවන්තයා මේ ලෝකයේ ඉටුකර ඇති යහපත තුලින් සොයාගනු ලබන්නේ සදාකාලිකත්වය පමණි. එබැවින් අපි වැඩ කරමු. ප්‍රතිඵලය දෙවියන් වහන්සේ සමඟ තබා දෙවියන් වහන්සේ තුළ අපගේ ශ්‍රමය නිශ්ඵල නොවන බව අප දන්නා තරමට අපි වැඩ කරමු. වැඩිපුර වැඩ කිරීමට කරුණාව ඉල්ලා යාච්ඤා කරමු. (1 කොරින්ති 15:58)

යාච්ඤාවේ උද්යෝගය

ආර්.ඒ. ටොරි විසිනි. 1856-1928

එය දෙවියන් වහන්සේ අවධානය යොමු කරන උන්වහන්සේ පිළිතුරු ලබාදෙන දැඩි උනන්දුවෙන් කරන යාච්ඤාවයි. මෙම සිතුවිල්ල නැවත නැවතත් මතුවේ. අපට එය පරණ ගිවිසුමේ පවා දකින්නට ලැබේ. **"නුඹලා මා සොයනවා ඇත. නුඹලාගේ වුළු සිතින් මා සොයන කළ මා නුඹලාට සම්බවෙනවා ඇත. "(යෙරමියා 29:13)** අපගේ බොහෝ යාච්ඤා දෙවියන් වහන්සේ නොඇසීමට හේතුව මෙහිදී අපි සොයන්නෙමු. ඔවුන්ගේ මුළු සිතින් දෙවියන් වහන්සේව සොයන්නේ නැති අතර ඉල්ලන දේ සඳහා ඇති ආශාවේ තියුණු බවද අල්පය. දෙවියන් වහන්සේට ඊට අවධානය යොමු කිරීමට හේතුවක් නොමැත.

මම ඔබ සෑම දෙනාගෙන් උදෑසන ඔබ යාච්ඤා කළාද කියා අසුවොත් නිසැකවම ඔබ සෑමදොනම පාහේ ඔව්, මම යාච්ඤා කළා කියා පිළිතුරු දෙනු ඇත. ඉන්පසු මම ඔබ උදෑසන යාච්ඤා කළේ කුමක් සඳහා ද කියා ඇසුවොත් ඔබගෙන් සමහර අය පැකිලී ඇත්තටම මම අද උදෑසන යාච්ඤා කළේ කුමකටද කියා මට අමතකවී යැයි පවසන්වා ඇසීමට මම බිය වෙමි. යාච්ඤා කළේ කළේ කුමකටදැයි ඔබට අමතක නම් දෙවියන් වහන්සේ පිළිතුරු ලබාදීමට ද අමතක කරනු ලබන සේක. ඒ අතරම මම ඔබ අතරෙන් සමහර අයගෙන් අද උදෑසන යාච්ඤා කළා ද කියා ඇසුවොත් ඔව් කියා පිළිතුරු ලබාදෙනු ඇත. එවිට ඔබ යාච්ඤා කළේ කුමකටද කියා ඇසුවොත් ඔබට එය එකවරම පැවසිය හැකිය. මන්ද ඔබ සෑමවිටම එකම දෙයකට යාච්ඤා කරන බැවින්ය. ඔබ සෑම උදෑසනකම හෝ සෑම රාත්‍රියකම කරන යාච්ඤාවේ කුඩා වාක්‍යය කොටසක් ඉබේටම පවසන අතර ඔබ පවසන දේ ගැන සිතන්නේ කලාතුරකිනි. ඇත්ත වශයෙන්ම ඔබ පවසන දේ ගැන නොසිතන නමුත් ඔබ ඔබේ යාච්ඤාව නැවත නැවතත් කරන අතර තුර තවත් දේවල් බොහෝමයක් ගැන සිතමින් සිටියි. එවැනි යාච්ඤාවන් දේව අපහාසයක් වන අතර දෙවියන් වහන්සේගේ නාමය නිශ්ඵල ලෙස භාවිතා කිරීමකි.

නමුත් අද උදෑසන ඔබ යාච්ඤා කළේ කුමක් සඳහා දැයි මම ඔබගෙන් කෙනෙකුගෙන් ඇසුවොත් ඔබට එය පැවසිය හැකිය. මක්නිසාද යාච්ඤා කරමින් සිටියදී දෙවියන් වහන්සේගේ ආත්මය ඔබ කෙරෙහි පැමිණි අතර ඔබට තිබිය යුතු දේ සඳහා ඔබ දැඩි ආශාවකින් සහ මුළු හදවතින් දෙවියන් වහන්සේට මොර ගැසීමයි. දෙවියන් වහන්සේ ඔබේ යාච්ඤාවට සවන්දී ඔබ ඉල්ලන දේ ඔබට ලබාදෙනු ඇත.

අපි බලයෙන් යුතුව යාච්ඤා කිරීමට නම්, අපි දැඩි උන්නදුවෙන් යාච්ඤා කළ යුතුය. අපගේ මුළු ආත්මයම යාච්ඤාවට යොමු කළ යුතුය. මෙම අදහස බයිබලයේ නැවත නැවතත් මතුවී පෙනේනේය. උදාහරණයක් වශයෙන් රෝම පොතොන් මෙම පදය සඳහන් කරන්නෙමු. **"නුඹලා මා උදෙසා දෙවියන් වහන්සේට කරන නුඹලාගේ යාච්ඤාවලදී මා සමඟ බලවත් ලෙස වීර්යය කරන හැටියට අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නිසාද ආත්මයාණන් වහන්සේගේ ප්‍රේමය නිසාද නුඹලාගෙන් ඉල්ලමි." (රෝම 15:32)** මෙම පදයේ **"බලවත් ලෙස වීර්යය කරන හැටියට"** යන වචන **"සුනගොනිසෝ"** යන ග්‍රීක වචනයෙන් පරිවර්තනය වී **"අගනිසෝ"** යන වචනය පැමිණ ඇත. එම වචනයෙහි අර්ථය තරඟ කිරීම, පරාජය කිරීම, පොරබැදීම හෝ සටන් කිරීම යන්නයි. තවද මෙම පදය නිවැරදිව පරිවර්තනය කළ හැකි වන්නේ .... සහෝදරවරුනි, ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ උදෙසාත්, ආත්මයාණන් වහන්සේගේ ප්‍රේමය උදෙසාත්, මා වෙනුවෙන් දෙවින් වහන්සේට කරන යාච්ඤා වලදී මා සමඟ එක්ව පොරබදන ලෙස මම ඔබගෙන් ඉල්ලා සිටිමි යනුවෙනි.

ඉතා දුෂ්කර මැදිහත්වීම

යාච්ඤාවෙන් පොරබැදීම හෝ සටන් කිරීම යන අදහස දෙවියන් වහන්සේ අපගේ යාච්ඤාවලට පිළිතුරු ලබාදීමට කැමැත්තක් ඇතිකර ගැනීම සඳහා අපි දෙවියන් වහන්සේ සමඟ පොර බැදිය යුතු බවට ඇති අදහසක් නොවේ. **"එක්නිසාද අපේ පොරබැදීම වනාහී මාංශයට හා ලේඩියට විරුද්ධව නොව, අධිපතිකම්වලටත්, පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාර ලෝක ව්‍යාප්තියේ ආත්ම සේනාවටත් විරුද්ධවය. " (එපීස 6:12)** යක්ෂයා සහ ඔහුගේ සියලු බලවේග අපි යාච්ඤා කරන විට තරම් අපට විරුද්ධවෙන තවත් තැනක් නොමැත. නිරයේ සියලු බලවේග අප සහ දෙවියන් වහන්සේ අතර ගසාගෙන ගියාක් මෙන් පෙනෙන්නේය. අපි කුමක් කරමුද ? අත්හරින්න, නැහැ, දහස් වාරයක් නැහැ. ඔබ දණින් වැටී සිටින්නා වූ කාරණය සමඟ සටන්වදින්න, දෙවියන් වහන්සේට කරන ඔබේ යාච්ඤාවෙන් පොරබදන්න සහ ජයග්‍රහණය කරන්න. දෙවියන් වහන්සේ සමඟ ජයගන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් අප සැබවින්ම පොරබදමින් කරන යාච්ඤාවයි. **"එක්ව පොරබදන්න"** යනුවෙන් පරිවර්තනය කර ඇති ග්‍රීක් වචනය **"අගෝනේ"** යන වචනය වන අතර එයින් **"ඇගනි"** යන ඉංග්‍රීසි වචනයත්, සිංහල භාෂාවේ "වේදනාව" යන වචනයත් පැමිණේ. ඇත්ත වශයෙන්ම ලූක් 22:44 වන පදයෙහි වේදනාව ලෙස පරිවර්තනය කර ඇති වචනය මෙයයි. **"උන්වහන්සේ මහත් වේදනා වින්ද සේක් වඩා ඕනෑකමින් යාච්ඤා කළ සේක. "උන්වහන්සේගේ ඕදිය ද මහත් ලේ බිංදු මෙන් බිම වැටුණේය. "(ලූක් 22:44)** අපටත් වඩාත් වේදනාවෙන් යාච්ඤා කළ හැකි නම් යහපත්ය.

උනන්දුවෙන් වැඩකරන්න.

දැන් අපි කොලොස්සි 4:12-13 පද වෙතට හැරෙමු. එවිට ඔබට නැවතත් එම අදහසම හමුවනු ඇත. **"නුඹලාගෙන් එක්කෙනෙක් වූ ක්‍රිස්තුස් යේසුස් වහන්සේගේ දාසයෙක් වූ එපප්‍රස් නුඹලාට ආශාව කරන්නේය. නුඹලා දෙවියන් වහන්සේගේ මුළු කැමැත්තෙහි සම්පූර්ණව නිසැකව සිටින පිණිස ඔහු යාච්ඤාවෙන් නුඹලා ගැන නිතර්ව වීර්යය කරන්නේය. එක්නිසාද නුඹලා උදෙසාත් ලවෝදිකයෙහිද, හියරපොලිසෙහිද සිටින්නන් උදෙසාත් ඔහු බොහෝ වෙහෙසෙන බවට මම සාක්ෂි දරමි." (කොලොස්සි 4 : 12-13)**

යාච්ඤාවෙන් වෙහෙසීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි ඔබ දන්නවාද ? යාච්ඤාවෙන් වේදනාකාරී වෙහෙසක් දරමින් වෙහෙසීම වේ. අපගෙන් බොහෝ දෙනෙක් අපගේ යාච්ඤාව කොයිතරම් පහසුවෙන් භාරගන්නවාද ? අපි එයට ලබාදෙන්නේ හදවතේ කොයිතරම් කුඩා ස්ථානයක් ද ? සියවස් ගණනාවක් පුරා යාච්ඤාවෙන් මහත් දේවල් කළ දෙවියන් වහන්සේගේ බලවත් මිනිස්සු යාච්ඤාවෙන් බොහෝ වේදනාකාරී වෙහෙසක් දැරූ මිනිසුන්ය. උදාහරණයක් ලෙස ඩේවිඩ් බ්‍රේනර්ඩ් ශාරීරිකව දුර්වලව සිටිය නමුත් ආත්මිකව දෙවියන් වහන්සේගේ බලවත් වූ මනුෂ්‍යයෙක් විය. වසර ගණනාවක් යාච්ඤාවේ සටනේ යෙදී සිටීමෙන් අනතුරුව මිය ගියේය. ඩේවිඩ් බ්‍රේනර්ඩට මුල් දිනවල උතුරු පෙන්සිල්වේනියාවේ ප්‍රාථමික වනාන්තරවල උතුරු ඇමරිකානු ඉන්දියානුවන් අතර වැඩ කිරීමට දෙවියන් වහන්සේ විසින් මඟ පෙන්වනු ලැබූ බවක් දැනුණි. සමහර විට ශීත රාත්‍රියක ඔහු වනාන්තරයට ගොස් අඩියක් ගැඹුරට සීතල හිම පතනයෙහි දණගසා දෙවියන් වහන්සේ සමඟ යාච්ඤාවෙන් වෙහෙස මහන්සිවී වැඩ කළේය. සීතල ශීත රාත්‍රී පැයවලදී පවා ඔහු දහඩියෙන් තෙත්වෙමින් සිටියේය. දෙවියන් වහන්සේ ඩේවිඩ් බ්‍රේනර්ඩට සවන් දුන් අතර උතුරු ඇමරිකානු ඉන්දියානුවන් අතර මීට පෙර කවදාවත් අසා නොතිබූ සැබවින්ම සිහිනෙන්වත් නොසිතූ තරම් බලවත් පිබිදීමක් එවූ සේක.

යාච්ඤාව තුළ තීව්‍රතාවය ලබා ගන්නේ කෙසේද ?

මේ අවස්ථාවේදී ඉතා ප්‍රායෝගික ප්‍රශ්නයක් පැණනගී. යාච්ඤාවේදී අපට මෙම දැඩි උන්නදුව ලබාගත හැකි වන්නේ කෙසේද ? බයිබලයේ මෙම ප්‍රශ්නයට ඉතා පැහැදිලිව සහ සරලව පිළිතුරු ලබාදෙයි. යාච්ඤාවේ උනන්දුව ඇතිකර ගැනීමට ක්‍රම දෙකක් තිබේ. එනම් නිවැරදි මාර්ගය හා වැරදි මාර්ගයයි. වැරදි මාර්ගය නම්, මාංශයේ ශක්තියෙන් එය ක්‍රියාත්මක කිරීමයි. නමුත් යාච්ඤාව තුළ සැබෑ හදවත උණුසුම් කරවන, හදවත කම්පාකරවන සහ දෙවියන් වහන්සේව පොළඹවන උන්නදුව ලබා ගැනීමට නිවැරදි මාර්ගයක් තිබේ. නිවැරදි මාර්ගය කුමක්දැයි බයිබලය අපට පෙන්වා දෙයි. **"එලෙසම ආත්මයාණන් වහන්සේත් අපගේ දුර්වලකම්වලදී උපකාර කරන සේක . එක්නිසාද යුතු ලෙස යාච්ඤා කරන්ට අපි නොදනිමුව. නුමුත් ආත්මයාණන් වහන්සේම කිය නොහැකි කෙඳිරිගැසීවලින් අප උදෙසා මැදහත්කම් කරන සේක. ඒ ආත්මයාණන් වහන්සේ දෙවියන් වහන්සේගේ කැමැත්ත ලෙස ශුද්ධවන්තයන් උදෙසා මැදහත්කම් කරන බැවින්, සිත් විමසන තැනන් වහන්සේ උන්වහන්සේගේ අදහස කුමක්දැයි දන්නා සේක. "(රෝම 8:26-27)**

නිවැරදි මාර්ගය එයයි. උනන්දුව ඇති කර ගැනීමට ආත්මයාණන් වහන්සේ දෙස බලන්න. දෙවියන් වහන්සේ ඉදිරියේ ගණන් ගනු ලබන්නේ ඔබ හෝ මම වැඩ කරන උනන්දුව නොවේ. එය ශුද්ධාත්මයාණන් වහන්සේ අපගේ හදවත් තුළ ඇති කරන උනන්දුවයි. ඔබගේ යාච්ඤාවේ කිසිසේත් උනන්දුවක් නැතිනම්, ඔබ කිසිවිටෙකත් යාච්ඤාවෙන් දෙවියන් වහන්සේ වෙතට ගොස් නැත. එය හුදෙක් වචන සහ ස්වරූපය පිළිබඳ කාරණයක් වේ. ඔබේ හදවතේ සැබෑ යාච්ඤාවක් නොතිබූ බව පෙනෙන්නට තිබේද? එවැනි අවස්ථාවක අපි කරන්නේ කුමක්ද ? යාච්ඤා කිරීම නැවත අපට යාච්ඤා කිරීමට අවශ්‍ය වන තෙක් බලා සිටින්නේද ? නැත. දෙවියන් වහන්සේගේ පොරොන්දුවට අනුව ඔබගේ හදවත යාච්ඤාවට යොමු කිරීමට, අවදිකිරීමට සහ යාච්ඤාවෙන් ඔබගේ හදවතේ සැබෑ උනන්දුව ඇති කිරීමට උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේව එවන ලෙස උන්වහන්සේ දෙස බලන්න. එවිට ශුද්ධාත්මයාණන් වහන්සේව එවනු ලබන අතර, ඔබ දැඩි උනන්දුවෙන් යාච්ඤා කරනු ඇත. බොහෝ විට කිව නොහැකි කෙඳිරිගෑම් සමඟය.

යාච්ඤාවේද මා මෙතෙක් දැන සිටි ගැඹුරුම අවශ්‍යතාවයේ සමහර අවස්ථා ආරම්භයේදීම මගේ හදවතේ කිසිඳු යාච්ඤාවක් නොතිබූ බව මට මෙහිදී සාක්ෂිදීමට අවශ්‍යව තිබේ. යාච්ඤා කිරීමට ගත් සියලුම උත්සාහයන් හුදෙක් වචන සහ හිස් ස්වරූපයක් විය. ඉන්පසු දෙවියන් වහන්සේ මට යාච්ඤා කිරීමට ඉගැන්වීමට උන්වහන්සේගේ පොරොන්දුවට අනුව උන්වහන්සේගේ ආත්මය එවන ලෙස දෙවියන් වහන්සේ දෙස බැලූවෙමි. මම බලා සිටි විට දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ බලවත් වූ බලයෙන් මා වෙත පැමිණි අතර මම දෙවියන් වහන්සේට මොර ගැසුවෙමි. සමහර විට කිව නොහැකි කෙඳරිගෑමත් සමඟය. චිකාගෝ හී රාත්‍රියක් මට කවදාවත් අමතක වන්නේ නැත.

8 පිටුවට

Reg. No: DOP/MAGAZINE/28/2026
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

7 පිටුවෙන්

යාච්ඤාවේ උද්යෝගය...

ලෝක ව්‍යාප්ත පිබිදීමක් සඳහා වූ සාමාන්‍ය යාච්ඤා රැස්වීම් ටික කාලයක් තිස්සේ පැවතුණා. පසුව රැස්වීම්වල මා සමඟ වඩාත් සමීපව ඇසුරු කළ පුද්ගලය රැස්වීම අවසන් වූ පසු එක් රාත්‍රියක් මගේ නිවසට පැමිණ සහෝදර ටෝරී, අනෙක් රැස්වීම් අවසන් වූ පසු සෑම සෙනසුරාදා රාත්‍රියකම දෙවියන් වහන්සේ සමඟ තනිව කාලය ගත කිරීම ගැන ඔබ කියන්නේ කුමක්ද ? ඇත්තටම සෑම රාත්‍රියකම අපි එකට එකතු වෙනවා කියා මම කියන්නේ නැහැ. නමුත් කෙසේ හෝ අද රාත්‍රියේ එලෙස කරමු යැයි කීවෙමි. ඒ රාත්‍රියේ යාච්ඤාව මට කවදාවත් අමතක වන්නේ නැත. නුමුත් මම දැන් සිතන්නේ එම රාත්‍රිය ගැන නොවේ. සති කිහපයක් රැස්වීමෙන් පසු ඔහු යෝජනා කළේ තවත් කිහිපදෙනෙකුට ආරාධනා කරන ලෙසයි. අපි එය කළෙමු. සෑම සෙනසුරාදා රාත්‍රියකම සාමාන්‍ය යාච්ඤා රැස්වීම රාත්‍රී දහයට අවසන් වූ පසු අපි කිහිපදෙනෙක් අන් අයට බාධා නොකරන යම් හුදකලා ස්ථානයකට රැස්වී යාච්ඤා කළෙමු. සාමාන්‍යයෙන් හයදෙනෙකු හෝ හත්දෙනෙකු එසේ කළෙමු. දොළොස්දෙනෙකුට වඩා වැඩි පිරිසක් කිසිවිටෙකත් එහි සිටියේ නැත.

එක් රාත්‍රියක අපි යාච්ඤා කිරීමට රැස්වූ විට දණගසා යාච්ඤා කිරීමට පෙර ඒ රාත්‍රියේ දෙවියන් වහන්සේගෙන් විශේෂයෙන් ඉල්ලා සිටීමට අවශ්‍ය දේවල් අපි එකිනෙකාට පැවසුවෙමු. පසුව අපි යාච්ඤා කිරීමට දණගසා දිගු නිහඬතාවයක් ඇති කළෙමු. කිසිවෙකු යාච්ඤා කළේ නැත. කුඩා කණ්ඩායමේ එක් අයෙකු හිස ඔසවා මෙසේ පැවසීය. මට යාච්ඤා කළ නොහැකියි. යමක් මට විරුද්ධ වන බව පෙනෙන්නේය. එවිට තවත් අයෙක් හිස ඔසවා මටත් යාච්ඤා කළ නොහැකියි මටත් යමක් විරුද්ධ වෙන බව පෙනෙනවා යැයි කීවේය. අපි මුළු රවුම වටා ගිය අතර සෑම කෙනෙකුටම එකම කථාව තිබුණි. අපි කළේ කුමක්ද ? අපි යාච්ඤා රැස්වීම නතර කළාද ? නැත. අපට කවදා හෝ යාච්ඤාවේ අවශ්‍යතාවය දැණුනා නම් ඒ එදාය. අපි හැමෝම නිහඬව දෙවියන් වහන්සේ ඉදිරියේ වැඳ වැටී ජයග්‍රහණය සඳහා යාච්ඤා කිරීමට අපට හැකියාව ලබාදීම සඳහා උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේව එවන ලෙස උන්වහන්සේ දෙස බැලුවෙමු. ඉක්මනින් දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ එකිනෙකා කෙරෙහි පැමිණි අතර ඒ රාත්‍රියේම මා ඇසූ තරම් යාච්ඤා කිරීම කලාතුරකින් මම අසා ඇත්තෙමි.

එවිට දෙවියන් වහන්සේගේ ආත්මය මා කෙරෙහි පැමිණ මම කිසිවිටෙකත් යාච්ඤා කිරීමට සිතන්නේවත් නැති ආකාරයේ යාච්ඤාවකින් මාව පූර්ණ කළ සේක. ලොව පුරා සුභාරංචිය දේශනා කිරීමට මාව යවන ලෙසත් චීනයේ, ජපානයේ, ඕස්ට්‍රේලියාවේ, නවසීලන්තයේ, ටස්මේනියාවේ , ඉන්දියාවේ, එංගලන්තයේ, ස්කොට්ලන්තයේ, අයර්ලන්තයේ, ජර්මනියේ, ප්‍රංශයේ සහ ස්විට්සර්ලන්තයේ දහස් ගණනක් ගැලවීම ලැබුවා වූ අයව දැකීමට මට ඉඩදෙන ලෙසත් දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටීමට මට මඟ පෙන්වනු ලැබූ සේක. ඒ රාත්‍රියේ මම යාච්ඤා කිරීම අවසන් කළ විට මම ඒ ස්ථානවලට යන බව දැන සිටියෙමි. දෙවියන් වහන්සේ කළ බලවත් දේවල් පිළිබඳ සැබෑ වාර්තාව පසුව පැමිණිවිට මා දැනගත් ආකාරයටම මම දකින්නට යන දේ ගැන මම දැන සිටියෙමි. මම යාච්ඤා රැස්වීම ලොවපුරා සුභාරංචිය දේශනා කිරීමට මාව යවනු ලැබීය.

අපි යාච්ඤාවෙන් ඉල්ලන දේ ලබා ගැනීමට නම් ශුද්ධාත්මයාණන් වහන්සේ පමණක් උත්පාදනය කළ හැකි දැඩි උන්නදුවකින් යාච්ඤා කළ යුත්තේ එලෙසිනි.

පසුගිය කලාපයෙන්

දෙවියන් වහන්සේ කෙරෙහි භය

"දෙවියන් වහන්සේගේ හඳවත ඔවුන් කෙරෙහිය."

ඔවුන්ගේ සියලු දුක් කරදරවලදී, පරක්ෂාවලදී, ක්‍රියාකාරකම්වලදී උන්වහන්සේ ඔවුන් කෙරෙහි දයාව, අනුකම්පාව දක්වන සේක. ඔවුන්ගේ දුක් පීඩාවලදී උන්වහන්සේ ඔවුන් වෙනුවෙන් වේදනා විඳිමින් ඔවුන්ව සනසන සේක. "පියෙක් තම දරුවන්ට අනුකම්පා කරන්නාක් මෙන් ස්වාමීන්වහන්සේ තමන් කෙරෙහි භය ඇත්තන්ට අනුකම්පා කරන සේක." (ගීතාවලිය 103 : 13-14)

"ස්වාමීන්වහන්සේගේ ඇස් යහපත පිණිස ඔවුන් කෙරෙහිය."

"බලව, ස්වාමීන් කෙරෙහි භය ඇත්තන් සහ උන්වහන්සේගේ කරුණාව බලා සිටින්නන්ගේ ආත්මය මරණයෙන් ගලවන පිණිස, දුර්භික්ෂයේදී ඔවුන්ගේ ජීවිත ආරක්ෂා කරන පිණිසත්, උන්වහන්සේගේ ඇස් ඔවුන් කෙරෙහි යොමුකොට තිබේ. " (ගීතාවලිය 33: 18-19) ඔවුන් වෙනුවෙන් දෙවියන් වහන්සේ ශක්තිමත්ව සිටින බව පෙන්වීමට, ඔවුන් ආරක්ෂා කිරීමට සතුරන්ගෙන් පළිගැනීම පිණිස පොළොව පුරා දිවයන උන්වහන්සේගේ දැස් ආරක්ෂාව සඳහා පමණක් නොව ප්‍රේමය, කරුණාව, දයාව, ඔවුන් කෙරෙහි පවතින බව පෙන්වීමටත් වන අතර කිසිවිටෙකත් උන්වහන්සේගේ දැස් ඔවුන්ගෙන් ඉවත් නොවේ. නමුත් සෑමවිටම ඔවුන් කෙරෙහි සතුටු වන අතර ඔවුන් ගැන සැලකිලිමත් වන සේක. ගීතාවලිය 103 : 11,17, ලූක් 1:50)

"ස්වාමීන්වහන්සේගේ හස්තය විවෘතව සහ ඔවුන්ට සන්නිවේදනය කිරීමට සූදානම්ව තිබේ."

"උන්වහන්සේ තමන් කෙරෙහි භය ඇත්තන්ට කෑම දුන් සේක. උන්වහන්සේ ස්වකීය ගිවිසුම සදාකල්ම සිහිකරන සේක." (ගීතාවලිය 111:5) ආත්මික ආහාරද, උන්වහන්සේගේ ගිවිසුමේ ආශිර්වාද ද ලබාදෙන අතර, ඒවා සෑමවිටම උන්වහන්සේගේ සිහියේ තබාගන්නා සේක. උන්වහන්සේ ඔවුන්ට ඔවුන් සමඟ ගමන්කරන්නා වූ ශුද්ධාත්මයාණන් වහන්සේගේ සැනසිල්ල ලබාදෙන සේක. උන්වහන්සේ ඔවුන්ට කරුණාව, නැවුම්බව, සාරවත් සැපයීම ලබාදෙන සේක. අවසානයේ දී ඔවුන්ට තේජස ලබාදෙන අතර ඔවුන්ගේ ඇදහිල්ලට සහයවීමට, ඔවුන්ගේ බලාපොරොත්තුව දිරිමත් කිරීමට සහ උන්වහන්සේ කෙරෙහි ඔවුන්ගේ විශ්වාසය තබා උන්වහන්සේ මත යැපීමට අවශ්‍ය කිසිදු යහපත් දෙයක් ඔවුන්ගෙන් වලක්වන්නේ නැත.

"ස්වාමීන්ගේ රහස උන්වහන්සේ කෙරෙහි භය ඇත්තන් හා සමඟට, උන්වහන්සේ ස්වකීය ගිවිසුම ඔවුන්ට දන්වන සේක". (ගීතාවලිය 25:14) දෙවියන් වහන්සේගේ හදවතේ ඔවුන්ට දක්වන ප්‍රේමයේ සහ ඔවුන් කෙරෙහි උන්වහන්සේගේ කරුණාවන්ත සැලසුම්වල රහස් ඔවුන්ට හෙළිකරනු ලබන අතර එමගින් උන්වහන්සේ ඔවුන්ව උන්වහන්සේගේ සමීපතම සහ හදවතේ මිතුරන් ලෙස භාවිතා කරන සේක. තවද උන්වහන්සේ ඔවුන්ට තම ගිවිසුම, එහි ආශිර්වාද, පොරොන්දු සහ ඔවුන් කෙරෙහි දක්වන උනන්දුව පෙන්වා දෙන සේක. මෙයට අමතරව ස්වාමීන්වහන්සේ තමන්ට භය ඇත්තන්ගේ ආශාව ඉෂ්ඨකරන බවත්, ඔවුන්ගේ මොරගැසීම අසා ඔවුන්ව ගලවාගන්නා බවත් එකතු කළ හැකිය. (ගීතාවලිය 145:19)

උන්වහන්සේ විසින් ඔවුන් සිහිපත් කරනු ලබන්නේ උන්වහන්සේගේම සෙනඟ කෙරේ උන්වහන්සේ දක්වන කරුණාවෙනි, උන්වහන්සේගේ මෘදු දයාවෙන් සහ ප්‍රේමණීය කරුණාවෙන් ඒවා පුරාණයේ සිට පැවත එන්නකි. ඔවුන් පහත් තත්ත්වයක සිටින විට උන්වහන්සේ ඔවුන් සිහිකර එයින් පිටතට ගෙන එන සේක. උන්වහන්සේ ඔවුන්ට දුන් පොරොන්දු සිහිපත් කර ඒවා ඉටුකරන සේක. "එකල ස්වාමීන් වහන්සේ කෙරෙහි භය ඇත්තෝ එකිනෙකා සමඟ කථාකරගත්තෝය. ස්වාමීන් වහන්සේ ද කන්දී ඇසූ සේක. එවිට ස්වාමීන්වහන්සේ කෙරෙහි භය ඇත්තා වූ, උන්වහන්සේගේ නාමය සැලකුවාවූ අය ගැන උන්වහන්සේ ඉදිරියෙහි සිහිවීමේ පොතක් ලියන ලද්දේය." (මලාකි 3:16)

ස්වාමීන්වහන්සේගේ නාමයට භියවන අයට පොරොන්දුවී ඇත්තේ, නුමුත් මාගේ නාමය කෙරෙහි භය ඇත්තා වූ නුඹලා නික්ම ගොස් ගාලේ වස්සන් මෙන් පනින්නහුය. (මලාකි 4:2) ගැලවුම්කාර ක්‍රිස්තුස් වහන්සේ පැමිණ සමාව ලබාදෙන කරුණාව හා දයාව සොයා ගැනීමත්, යෙදවීමත් තුලින් තමන්වහන්සේව පෙන්වන සේක. "නුඹලා අතරෙන් ස්වාමීන්වහන්සේ කෙරෙහි භය ඇත්තා වූ උන්වහන්සේගේ මෙහෙකරුවාගේ හඬට කීකරුවන්නා වූ තැනැත්තා කවුද ? ආලෝකය නැතුව අඳුරෙහි ඇවිදින්නා වූ තැනැත්තේ ස්වාමීන්වහන්සේගේ නාමය කෙරෙහි විශ්වාස කර තමාගේ දෙවියන් වහන්සේ කෙරෙහි පිහිටා සිටීවා." (යෙසායා 50:10)

ගැලවීම කෙරෙහි ඇති උනන්දුව පිළිබඳ නැවුම් දැක්මත්, අලුත් යෙදුමක් මෙන්ම සම්පූර්ණ සතුට ස්වාමීන්වහන්සේට භියවන අයට ළංව තිබේ. (ගීතාවලිය 85:9) එවැනි පුද්ගලයන් සඳහා දෙවියන් වහන්සේගේ හදවතෙත්, කරුණාවේ ගිවිසුමේත්, ක්‍රිස්තුස් වහන්සේගේ අත්වල ආශිර්වාදලත් බලාපොරොත්තුවත්, ධර්මිෂ්ඨකමේ ඔටුන්නත් ලබාදෙන සේක. ඔවුන් උදෙසා ඇසින් නොදුටු, කනින් නොඇසූ, සිතින් මවා ගැනීමට නොහැකි වූ උතුම් සහ යහපත් දේ තැන්පත් කර තිබෙන සේක. "ඔබ කෙරෙහි භය ඇතතන්ට නිධානකොට තැබුවා වූ, ඔබ කෙරෙහි විශ්වාසය තබන්නන්ට මනුෂ්‍යය පුත්‍රයන් ඉදිරියෙහි ඔබ කළා වූ ඔබගේ යහපත්කම කොපමණ මහත්ද!" (ගීතාවලිය 31:19)

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැඟී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.